# නියමුවා

ISSN 1391 - 1031 | 2026 ජනවාරි | 29 වෙළුම | 07 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=


ආපදාවට පත් ප්‍රදේශවල දිගහැරුණු සහන සේවා











# රට ගොඩනැගීමේ වැඩපිළිවෙළ සැලසුම්සහගතව ඉදිරියට

## ජනපති අනුර කුමාර දිසානායක සහෝදරයා

ස්වභාවික ව්‍යසන වැළැක්වීමට නොහැකි වුවත්, ඒවායින් විය හැකි හානි වැළැක්වීමට දීර්ඝ කාලීන සැලසුමක් අවශ්‍ය බවත් රජයක් ලෙස විධිමත් පියවර ගණනාවක් ඔස්සේ ඒ සඳහා ප්‍රවිශ්ට වී ඇති බවත් පෙන්වා දුන් ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා, ආණ්ඩුවක් වශයෙන් තමන්ගේ වගකීම නිසි පරිදි ඉටු කළ බවට වන තෘප්තිය තමන්ට ඇති බවත් රට යළි ගොඩනැගීමේ වැඩපිළිවෙළ ඉතාම සැලසුම්සහගතව ඉදිරියට යමින් ඇති බවත් අවධාරණය කළේය.

ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 19වැනි දින මුදල් අමාත්‍යවරයා ලෙස පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳ පාර්ලිමේන්තු විවාදයේ පිළිතුරු කතාව සිදු කරමිනි.

මෑත ඉතිහාසයේ අපි ඉදිරිපත් කරන විශාලතම පරිපූරක ඇස්තමේන්තුව අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. අපි පසුගිය 05 වනදා දීර්ඝ විවාදයකින් පසු 2026 වසරට අවශ්‍ය වන අයවැය ලේඛනය පාර්ලිමේන්තුවේ සම්මත කර ගත්තා.

11 පිටුවට

## 03 ජන ජීවිතය ඔසවා තැබීමට...

මේ අභියෝගයට මුහුණදීමේ දී ප්‍රධාන අරමුණ බවට පත්වන්නේ ආපදාවකට ලක්වූ කිසිදු පුද්ගලයෙකු අත් නොහැර පෙර තිබූ තත්ත්වයට වඩා යහපත් ජීවන තත්වයක් සහිත ශ්‍රී ලංකාවක්...



## 05 'දිත්වා' කුණාටුව...

ජනතාවට සහන සැලසීමට කිසිවක් නොකළ, ඒ වෙනුවෙන් තම සාමාජිකයන් කිහිපදෙනෙක් හෝ මෙහෙයවීමට කටයුතු නොකළ විපක්ෂය දිගටම සිදු කළේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ගවල බොරු වැරදි සෙවීම...



## 09 පශ්චාත් ව්‍යසන සමයේ...

පශ්චාත් ව්‍යයසන යුගයන් යනු සමාජය වඩාත් අශිෂ්ට වීමේ අවදානමක් සහිත යුගයකි. ඊට හේතුව බොහෝ පිරිස්, සිය සාමාන්‍ය ජීවිතය අහිමි කර ගැනීමටක හෝ එම ජීවිතය නැවත ලබා ගැනීම පෙනෙන සීමාවෙන් එපිට පවතින, කිසියම් ආකාරයක අපේක්ෂාභංගත්වයකින්...




තරුණ........................ 04
ජාත්‍යන්තර........................ 06
ආර්ථිකය ........................ 07
කාන්තා........................ 08
විශේෂාංග........................ 10
වේදිකාව........................ 11


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# සහකම්පිත සෙනෙහසේ තරණය...

## ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයෙන් මෙහෙයුමක්



ආපදාවට පත් ජනතාවගේ ජීවිත නගාසිටුවීම වෙනුවෙන් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය මගින් පසුගියදා මෙහෙයුමක් දියත් කරන ලදී. ඒ සඳහා ද්‍රව්‍ය ආධාර ලබාදීම් මෙන්ම ශ්‍රම දායකත්වය ලබාදෙමින් මැදිහත්වීම් පසුගිය දෙසැම්බර් 13, 14, 15 තෙදින පුරා බදුල්ල, නුවරඑළිය, මහනුවර සහ පුත්තලම දිස්ත්‍රික්කවලදී සිදු විය.

මෙහිදී පාසල් උපකරණ හා වෙනත් ද්‍රව්‍ය ආධාර ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය වෙත පරිත්‍යාග ලෙස ලබා ගැනුණු අතර ඒවා ආපදාවට පත් දිස්ත්‍රික්ක වෙත ලබා දෙනු ලැබිණි. එම තෙදින පුරා වෘත්තීය සමිති සාමාජිකයෝ විශාල පිරිසක් සිය ශ්‍රම දායකත්වය ලබාදෙමින් පාසල් පිරිසිදු කිරීම, අමුණු සැකසීම, වැව් බැම් පිළිසකර කිරීම හා නිවෙස් පවිත්‍ර කිරීම ඇතුළු ජන ජීවිතයට අදාළ කාර්යයන් රැසක් සිදු කළහ. එසේම දුම්රිය සේවකයින් ස්වේච්ඡාවෙන් අඛණ්ඩව දුම්රිය මාර්ග අලුත්වැඩියාවට සම්බන්ධ වූ අතර ප්‍රවාහන, වරාය, ඉංජිනේරු සංස්ථා, විදුලි, සෞඛ්‍ය සේවා ඇතුළු රාජ්‍ය අංශය නියෝජනය කරමින් ආයතන රැසක් හා පෞද්ගලික අංශයේ ආයතන රැසක සේවකයෝ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ මෙම ශ්‍රම මෙහෙයුම සඳහා සහභාගි වූහ. මේ සඳහා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ලේකම් මහින්ද ජයසිංහ, නියෝජ්‍ය ලේකම් චන්දන සූරියආරච්චි ඇතුළු වෘත්තීය සමිති නායකයෝ රැසක්ද එක්ව සිටියහ.

## අන්තරෙන් දෙදින ශ්‍රම මෙහෙයුමක්



ආපදාවට පත් ප්‍රදේශවල ජන ජීවිත නගා සිටුවීම වෙනුවෙන් අන්තර් සමාගම් සේවක සංගමය මගින් සංවිධානය කරන ලද දෙසැම්බර් 13-14 දෙදින ශ්‍රම මෙහෙයුම හා අධාර උපකරණ ලබාදීම බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්කවලදී සිදුකෙරිණි. මේ සඳහා අන්තර් සමාගම් සේවක සංගමයේ ශාඛා නියෝජනය කරමින් මංචි, මිල්කෝ, ලංකා ටයිල්, රෝයල් සෙරමික්, සියැට්, කෝස්ත්‍රෙඩ්, එයාර් ලංකා කේටරින් ඇතුළු ශාඛා ගණනාවක සාමාජික සාමාජිකාවෝ සක්‍රීයව දායක වී සිටියහ.

## ගුරුසේවා සංගමයත් ආපදා ප්‍රදේශවල වැඩට බසී



පසුගිය දෙසැ. 12-13-14 තෙදින පුරා ලංකා ගුරුසේවා සංගමය ආපදාවට පත් ප්‍රදේශවල පාසල් පිරිසිදු කිරීමේ තෙදින මෙහෙයුමක් සංවිධානය කරන ලද අතර ඒ වෙනුවෙන් විශාල ගුරු සංගම් සාමාජිකත්වයක් මහනුවර දිස්ත්‍රික්කයට එක් විය. පාසල් හා මාර්ග පිරිසිදු කරමින් සිදු කෙරුණු මෙම ශ්‍රම මෙහෙයුම සඳහා ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ, සභාපති ධම්මික අලහප්පෙරුම ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයෝ සම්බන්ධ වී සිටියහ.

## සෞඛ්‍ය සේවකයෝ එක්දින වැටුප් පරිත්‍යාග කරති



ආපදාවට ලක් වූ ජනතාවගේ ජීවිත ගොඩනැගීම වෙනුවෙන් වර්තමාන රජය ආරම්භ කර ඇති වැඩපිළිවෙලට සමගාමීව එම සහන කටයුතු වෙනුවෙන් රෝහල් රැසක සෞඛ්‍ය සේවකයෝ එක්දින වැටුප් පරිත්‍යාගයක් සිදුකළහ. ඒ අනුව ජාතික රෝහල, දකුණු කොළඹ ශික්ෂණ රොහල, රිජ්වේ ආර්යා ළමා රෝහල, අම්පාර රෝහල, ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය, බොරැල්ල වෛද්‍ය පර්යේෂණායතනය ඇතුළු රෝහල් හා ආයතන රැසක මෙම වැටුප් පරිත්‍යාග කිරීම් සිදුකරනු ලැබිණි. වෛද්‍යවරුන්, හෙද හෙදියන්, පරිපූරක සේවයේ වෘත්තිකයන් ඇතුළු රෝහල් කාර්ය මණ්ඩල සාමාජිකයෝ මෙම අවස්ථාවන් සඳහා එක්ව සිටියහ.

## රාජ්‍ය විශ්වවිද්‍යාල ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒමට ව්‍යාපෘති 16ක්

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය ජාත්‍යන්තර මට්ටමින් පිළිගත් විද්‍යාර්ථීන් බිහිකිරීම දක්වා ගුණාත්මක පරිවර්තනයක් වෙනුවෙන් රුපියල් මිලියන 46,317ක් වෙන්කර තිබේ.

අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන වෘත්තීය පුහුණු අමාත්‍යවරිය හැටියට අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය සහෝදරිය මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කැබිනට් සංදේශයට අනුමැතිය ලබාදෙන ලදී. මේ අනුව 2026 වසරේ සිට 2030 දක්වා තෝරා ගත් ව්‍යාපෘති 16ක් විශ්වවිද්‍යාල පද්ධතියම ආවරණය වන සේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මේ යටතේ වැඩිම මුදලක් එනම් රුපියල් මිලියන 26,625ක් වෙන්කර තිබෙන්නේ විද්‍යාර්ථීන්ගේ නේවාසික පහසුකම් සැපයීමේ ව්‍යාපෘති වෙනුවෙන්ය.

## මහවැලිය පිම්මක් පනින සූදානමක

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩ සටහනේ දෙවන අදියර යටතේ වාණිජ කෘෂිකර්මය සංවර්ධනය කිරීම සඳහා හෙක්ටයාර් 17,500ක් යොදවන අතර පවුල් එක්ලක්ෂ හැත්තෑපන්දහසකට පානීය ජලය සැපයීමටද සැලසුම් කර තිබේ. මෙම සමස්ත ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 536.5ක ඇස්තමේන්තුවක් සකස් කර ඇති අතර, එයින් ඩොලර් මිලියන 200ක් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබේ. මෙම ව්‍යාපෘතිය යටතේ හුරුලුවැව, මානකට්ටිය වැව, ඊරු වැව, මහකනදරාව වැව, නාච්චාදූව වැව, නුවර වැව සහ තිසා වැව යන ප්‍රධාන වාරි යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබේ.

## අස්වැසුම ප්‍රතිලාභීන් වෙනුවෙන් යෝධ පිම්මක්

අස්වැසුම සුබ සාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ලබන්නන් අතරින් හඳුනාගත් පවුල් ඉලක්ක කර නව නියමු ව්‍යාපෘතියක් හඳුන්වා දී ඇත.

එම ව්‍යාපෘතිය මගින් ඉලක්ක කර තිබෙන්නේ එම පවුල් ස්වයං රැකියා හෝ ව්‍යාපාර කෙරෙහි යොමු කිරීමය. ඒ වෙනුවෙන් එක් පවුලක් වෙත රුපියල් එක්ලක්ෂ පනස් දහසකට උපරිමයකට යටත්ව මූල්‍ය ප්‍රදානයක් ලබාදී ප්‍රාග්ධන ආයෝජනයක් සිදුකරනු ලැබේ. එම නියමු ව්‍යාපෘතිය වෙනුවෙන් ග්‍රාම සේවා වසම් 839කින් ප්‍රතිලාභී පවුල් 23,775ක් තෝරාගෙන 2027 දක්වා ව්‍යාපෘතිය දියත් කිරීමට නියමිතය.

## ජපන් රැකියා අවස්ථා පුළුල් කෙරේ

ජපානයෙන් ශ්‍රී ලංකාවට ලබාදෙන රැකියා අවස්ථා වැඩි කර ගනිමින් සුරක්ෂිත, ක්‍රමානුකූල සහ විධිමත් මාර්ග ඔස්සේ මෙරට තරුණ තරුණියන් හට අවකාශ ලබාදීමට අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට නියමිතය.

මේ සඳහා ශ්‍රී ලංකා විදේශ නියුක්ති සේවා කාර්යාංශයට අනුබද්ධිත ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම සහ ජපානයේ සෞඛ්‍ය කම්කරු සහ සුබසාධන අමාත්‍යාංශය යටතේ පවතින එන්ටර් ප්‍රයිසස් යුනයිටඩ් කෝපරේටිව් ආයතනය සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට කැබිනට් අනුමැතිය ලබාදී ඇත. මෙම රැකියා සඳහා තරුණ තරුණියන් පුහුණු කිරීම ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධ සපුගස්කන්ද ජාතික තරුණ සේවා සහ පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වීමට සැලසුම්කර තිබේ.

## ඖෂධ ගබඩා ධාරිතාව දින 22 සිට මාස 06 දක්වා පුළුල් කෙරේ

මේ වන විට වෛද්‍ය සේවා සැපයුම් අංශය සතුව පවතින ඖෂධ ගබඩා ධාරිතාවය දින 22ත් 30ත් අතර සීමාකාරී මට්ටමක පවතී.

මෙම සීමාවන් බිඳදමා මෙරට වාර්ෂික ඖෂධ අවශ්‍යතාවයෙන් මාස 06කට අදාළ සැපයුම් ලබාදිය හැකි ආකාරයට ගබඩා ධාරිතාව පුළුල් කිරීමට සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබූ සංදේශය අනුමත කර තිබේ. මේ අනුව ඉදිරි මාස කිහිපය තුළදී ඖෂධ හිඟය අවම කිරීමටත් මාස තුනකට ප්‍රමාණවත් තොග ගබඩා පවත්වාගෙන යාමටත් මුල් අදියරේදී පියවර ගැනීමට නියමිතය.

මේ සඳහා අවශ්‍ය ගබඩා පහසුකම් ඉක්මනින් ලබා ගැනීම සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සතු වෙයන්ගොඩ ඉඩමේ ගබඩා පහසුකම් ඇති කිරීමට ක්‍රියාකරමින් සිටී.

## නඩු ප්‍රමාදය අවසන් කිරීමට "ඊ කෝට්" (E - COURT) රට පුරා යයි

මෙරට අධිකරණ පද්ධතිය ඩිජිටල් පරිවර්තනයකට ලක් කරමින් නඩු විභාග කිරීමේ ප්‍රමාදය අවසන් කිරීම සඳහා පියවර රැසක් ගැනීමට සැලසුම් කර තිබේ.

මේ වන විටත් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු ගොනු කළමනාකරණය කිරීම, ඩිජිටල් කරණයට පරිවර්තනය කර, ඒ වෙනුවෙන් වෙබ් අඩවියක් සහ සබැඳි ඉලෙක්ට්‍රෝනික පද්ධතියක් (E- COURT) ශ්‍රේෂ්ඨාධිකරණයට අදාළව සාර්ථකව ක්‍රියාත්මක කෙරෙමින් පවතී. මේ අනුව ඉදිරියේදී එම ඩිජිටල් පද්ධති දෙක අභියාචනාධිකරණය, අධිකරණ සේවා කොමිෂන් සභාව විනිශ්චයකාරවරුන්ගේ ආයතනය යන අධිකරණ සංවිධාන මෙන්ම රට පුරා ඇති සියලුම අධිකරණ සඳහාද හඳුන්වා දීමට අදාළ ව්‍යාපෘති දියත් කිරීමට නියමිතය. මේ මගින් නඩු ප්‍රමාදය වැළැක්වීම, දත්ත විනිවිදභාවයක් නොමැතිකම සහ යුක්තිය සඳහා කාලෝචිත ප්‍රවේශයන්ට බාධා සිදුකරන අකර්මණ්‍යතා දුරුකිරීම සඳහා ලබන 2026 වසරේ සිට 2030 දක්වා 'ක්ලීන් ශ්‍රී ලංකා' වැඩසටහන යටතේ (E - COURT) රුපියල් මිලියන 150ක් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ලබාදීමට නියමිතය.

## තවත් නිෂ්පාදන කර්මාන්ත හතකට උපදේශක සභා

දේශීය නිෂ්පාදන කර්මාන්ත ශක්තිමත් කර ප්‍රවර්ධනය කිරීම සඳහා ක්ෂේත්‍ර 20ක් වෙනුවෙන් මේ වන විටත් උපදේශක සභා පිහිටුවා ඇති අතර, එම සභා සංඛ්‍යාව 27 දක්වා ඉහළ දැමීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබේ.

මේ අනුව දේශීය ආයුර්වේද හා පාරම්පරික වෛද්‍ය ක්ෂේත්‍රය, රසකැවිලි ආශ්‍රිත කර්මාන්ත, සාම්ප්‍රදායික හස්තකර්මාන්ත, කුකුල් මස් ආශ්‍රිත කර්මාන්ත, විසිතුරු මසුන් හා මුහුදු පැළෑටි ආශ්‍රිත කර්මාන්ත, නිර්මාණාත්මක කලා ආශ්‍රිත කර්මාන්ත සහ ඉසව් කළමනාකරණ ක්ෂේත්‍රය යන අංශ සඳහා උපදේශක සභා පිහිටුවීමට නියමිතය. එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයන් ඇතුළු 25දෙනෙකුට නොවැඩි සාමාජික සංඛ්‍යාවකින් යුක්තව මෙම සභා පත්කිරීමට නියමිතය.

## ශ්‍රී පාද රක්ෂිතය රකින නීති දැඩි වෙයි

සෑම වසරකම මාස හයක් පුරා ක්‍රියාත්මක වන ශ්‍රී පාද වන්දනා සමය තුළ එම පරිසරයට මුදා හරින නොදිරන අපද්‍රව්‍ය මෙන්ම දිරා යන අපද්‍රව්‍යද හෙළන්නන්හට දඬුවම් වැඩි කිරීමට පියවර ගෙන ඇත.

ශ්‍රී පාද අඩවියේ වන සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂාකර ගනිමින් එම සංවේදී භූමි භාගය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් මෙම නීති දැඩි කෙරේ. පොලිතින්, ප්ලාස්ටික්, බැටරි, පිඟන් කෝප්ප, හැඳි - ගෑරුප්පු, බීම බට ආදිය මෙම පද්ධතියට බැහැර කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කර ඇත. මෙම නියෝග කඩ කරන්නන් හට දැඩි දඬුවම් ලබාදීමට අදාළ නීතිමය ප්‍රතිපාදන සම්පූර්ණ කිරීමටද අවධානය යොමු කර ඇත.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# අභියෝග මතින් නැගී සිටින නව වසරක්!

2025 වසර අවසන් වූයේ ලංකා ඉතිහාසයේ මෑතකදී අප අත්දුටු දරුණුතම ස්වභාවික ව්‍යසනය වන 'දිත්වා' සුළි කුණාටුව විසින් කළ විනාශය සමගය. 2026 නව වසරට පා තබන විටත් එකී ව්‍යසනයේ අහිතකර බලපෑමේ අභියෝගය ජනතාව ඉදිරියේ තිබේ. මේ අභියෝගය අප ජය ගත යුතුය. 2026 නව වසරේ අපගේ අදිටන විය යුත්තේ එයයි.

පසුගිය වසර යනු ආර්ථික වශයෙන් බංකොලොත් කර, පතුලටම වට්ටවා, පාලකයන් විසින් ජනතාවගේ ඉරණම වැල්පාලමේ එල්ලා තිබූ රටක් යළි නැගීසිටීමට පියවර තැබූ වසරකි. ආර්ථික කළමනාකරණය, වංචා දූෂණ නතර වීම, මූල්‍ය විනය, හා ආණ්ඩුවේ ජනතාවාදී ප්‍රතිපත්ති නිසා වැටුණු ආර්ථිකය යළි හිස ඔසවමින්, ආර්ථික ස්ථාවරත්වය ගොඩනඟමින්, විශ්වාසය ගොඩනගමින් ආ වසරකි.

අනෙක් අතට 2026 නව වසර පිළිබඳ බොහෝ සුබවාදී සැලසුම් හා ප්‍රාර්ථනාද අප තුළ පොදි බැඳ තිබුණි. ලංකාවේ දිළිඳුකම තුරන්කිරීමේ 'ප්‍රජා ශක්ති' වැඩසටහන, 'ක්ලීන් ශ්‍රී ලංකා' වැඩසටහන, මත්ද්‍රව්‍ය හා පාතාලය අවසන් කිරීමේ සටන, මාර්ග සංවර්ධනය, කර්මාන්ත හා කෘෂිකර්මාන්තයේ නව සැලසුම් 2026 නව වසරේ ජය ගැනීමට තිබූ සැලසුම් විය. 'දිත්වා' සුළි කුණාටුව ඒවාටද හානි සිදුකර තිබේ. 'දිත්වා' මිනිස් ජීවිත දේපළ පමණක් නොව අනාගත සැලසුම්ද අභියෝගයට ලක්කළ ව්‍යසනයක් විය.

අප 2026 නව වසරට පා තබන්නේ 'දිත්වා' සුළි කුණාටුව විසින් විනාශ කළ මාර්ග, නිවාස, පාසල්, කර්මාන්ත, ගොවිපළ ඇතුළු භෞතික සම්පත්, යටිතල පහසුකම් හා සේවා යළි ගොඩනැගීමේ මෙන්ම වේදනාවට, දුකට පත් ජනතා සිත් සතන් සුවපත් කිරීමේ අභියෝගය රැගෙනය. එපමණක් නොව නව වසරේ ජය ගත යුතු ඉලක්ක ලෙස තිබුණු, මේ ව්‍යසනය විසින් හානි කළ, බාධා කළ ව්‍යාපෘති කෙසේ හෝ ජය ගැනීමේ අභියෝගයද අප ඉදිරිපිට තිබේ. මේ අභියෝග අපට ජය ගත හැක. ඒවා අප ජය ගත යුතුය. නව වසරේ අපේ අදිටන විය යුත්තේ එයයි.

ඕනෑම නරක තත්වයක් තුළ සැඟවුණු හොඳ දේවල්ද තිබේ. සමහර ව්‍යසන අපට නව අවස්ථාද නිර්මාණය කර දෙයි. මෙම ව්‍යසනය දෙස අප බැලිය යුත්තේ එසේය. මෙම ව්‍යසනයට පාරවල්, පාලම්, දුම්රිය මාර්ග, නිවාස, ගොවිපළ, කර්මාන්ත ශාලා, වතු විනාශ කිරීමට හැකි වුවද ජනතාවගේ අධිෂ්ඨානය බිඳ දැමීමට නොහැකි විය. ජනතාවගේ ධෛර්යය බිඳ දැමීමට නොහැකි විය. එය රටක් ලෙස අප ලැබූ ජයග්‍රහණයකි.

එසේම විපතකදී වහාම මැදිහත්වීමේ, එකිනෙකාට උපකාර කිරීමේ මානුෂික ගුණය, මේ විපත ඉදිරිපිට පෙන්වීමටද අපේ ජනතාවට හැකි විය. එම කරුණේදී ශ්‍රී ලාංකිකයා සියලු රටවලට ඉදිරියෙන් සිටින බව පැවසීම අතිශයෝක්තියක් නොවේ. මෑතකදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලංකා නියෝජිතයාද මේ බව ප්‍රකාශ කළේ තමන්ගේ රටට මෙවන් ව්‍යසනයක් වූයේ නම්, තම රටේ ජනයා වුවද මෙලෙස හැසිරේ යැයි තමන්ට විශ්වාස නැති බව පවසමිනි. ඒවා රටක ජයග්‍රහණයන්ය.

දැන් අප, මෙම ව්‍යසනය විසින් අප ඉදිරිපිට තබා ඇති සමස්ත අභියෝග ජය ගැනීමට එකාවන්ව නැගී සිටිය යුතුය. 'දිත්වා' කුණාටුවට වඩා ජනතාවගේ අධිෂ්ඨානය බලවත් බව ඔප්පු කළ යුතුය. මේ ව්‍යසනය රට පෙර පැවතියාට වඩා ක්‍රමවත්ව, විද්‍යාත්මකව යළි ගොඩ නැගීමේ අවස්ථාවක් කර ගත යුතුය. අපිළිවෙළට තිබූ, ඉදිකිරීම් පිළිවෙළක් කිරීමට, උස කඳුකර බිම් යළි වන වගා කිරීමට, සංවේදී පරිසර කලාප ආරක්ෂා කිරීමට, අවිධිමත් සංවර්ධන ක්‍රියා වෙනුවට විධිමත් හා විද්‍යාත්මක පදනමක සිට සංවර්ධන කටයුතු සිදු කිරීමට තනි වචනයෙන් කියන්නේ නම්, ලංකාව පෙර පැවතියාට වඩා බොහෝ ඉහළින් ඔසවා තැබීමට මෙය අවස්ථාවක් කර ගත යුතුය.

රට ගැන, පරිසරය ගැන, ඉදිකිරීම් ගැන ආර්ථික සංවර්ධනයේ පැරණි ක්‍රම ගැන ජනතාවගේ හුරුපුරුදු හා ක්‍රියාකාරකම් පිළිබඳ නැවත හැරී බලා වැරදි නිවැරදි කර ගැනීමටත් නව ක්‍රම අනුගමනය කිරීමටත් මෙම ව්‍යසනය විසින් අපට බල කරනු ලැබ තිබේ. මනුෂ්‍යත්වයේ වටිනාකම් ගැන අලුතින් සිතීමට මේ තත්වයන් අපට බල කරනු ලැබ තිබේ.

නව වසරේ අපේ අභියෝගය වන්නේ සියල්ල නිවැරදි කර ගනිමින් රට යළි ගොඩනැගීමය. ඒ තිබුණු තැනට නොව ඊට ඉහළට ගොඩනැගීමය. ඒ වෙනුවෙන් කැපවෙන වෙහෙසෙන, සිතන පතන සියලු දෙනාට නව වසර වෙනුවෙන් අපි සුබ පතමු.

# ජන ජීවිතය ඔසවා තැබීම අපේ අපේක්ෂාවයි



**ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය සහ කම්කරු අමාත්‍ය,**
**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු සහෝදරයා**

***2026 වර්ෂය සඳහා යෝජිත අයවැය විවාදය පාර්ලිමේන්තුවේ පැවැත්වෙන කාලසීමාව අවසානයේ රට විශාල ආපදා තත්වයකට මුහුණ දුන්නා. සැලසුම් කළ අයවැය නව තත්වයට අනුව වෙනස් වෙන්නෙ කොහොමද?***

*2026 වර්ෂයේ අයවැය මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන කිසිදු වෙනස් කිරීමකින් තොරව ඒ අයුරින්ම ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. අනපේක්ෂිත ලෙස මුහුණපෑමට සිදුවූ ආපදා තත්වය හේතුවෙන් සිදුවූ හානිය යථාවත් කිරීම සඳහා 2026 වර්ෂයට රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් අතිරේක මුදල් වෙන් කරනු ලැබුවා. ඊට අමතරව 2026 අයවැයේ සාමාන්‍ය පරිදි වෙන් කෙරෙන හදිසි සහ ආපදා තත්වයන්ට දැනටමත් වෙන්කර ඇති රු.බි. 100කට ආසන්න මුදලක්ද මේ සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරනවා.*

***මෙම මහා ව්‍යසනය රට යළි ගොඩනැගීමේ හැරවුමක් බවට පත් කර ගත යුතු බව ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා ප්‍රකාශ කළා. මේ සඳහා තිබෙන වැඩපිළිවෙළ කෙටියෙන් සඳහන් කළොත්?***

*මෙම වැඩපිළිවෙළ අදියර කිහිපයක් තුළ ක්‍රියාත්මක වකවා. දැනටමත් ආපදා තත්වයට මුහුණ පෑ සියලු ජනතාව ආරක්ෂිත ස්ථානවලට ගෙනයෑම, අවශ්‍ය ආහාර පාන ලබා දීම, ආපදා තත්ත්වය පහව ගිය පසු නැවත පදිංචි කරවීමේ කාර්යය සහ හානියට පත්වූ නිවාස, ව්‍යාපාරික ස්ථාන, කෘෂිකර්මාන්තය ඇතුළු අනෙකුත් ව්‍යාපාර කටයුතු මෙන්ම ප්‍රවාහන පහසුකම් සැලසීමේදී මහා මාර්ග සහ දුම්රිය මාර්ග යථා තත්වයට පත්කිරීමද වාරිමාර්ග, පාලම්, බොක්කු ඇතුළු යටිතල පහසුකම් නැවත ගොඩනගමින් තිබෙනවා. මෙම වැඩපිළිවෙළේ අරමුණ පෙර තිබූ ජීවන තත්වයටත් වඩා යහපත් තත්වයකට ජන ජීවිතය ඔසවා තැබීමයි. ඒ අනුව,*

- *නැවත පදිංචි වීමේදී නිවාස පිරිසිදු කරගැනීම සඳහා රු. 25,000 දීමනාව*
- *අත්‍යාවශ්‍ය ගෘහ උපකරණ මිලදී ගැනීම සඳහා රු. 50,000 දීමනාව*
- *ආදායම් අහිමි වූවන්ට රු. 25,000 බැගින් මාස තුනක් සඳහා වූ දීමනාව*
- *නව නිවසක් සාදාගන්නා තුරු රු. 25,000 බැගින් මාස 06ක් සඳහා නිවාස කුලිය ලබා දීම*
- *ඉඩම් අහිමිවූවන් සඳහා රු. 5,000,000 ලබාදීම*
- *මියගිය හෝ පූර්ණ ආබාධිත පුද්ගලයන් වෙනුවෙන් රු. 1,000,000 ලබාදීම*
- *ධාන්‍ය බෝග නැවත වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රු. 150,000 දක්වා ලබා දීම*
- *එළවළු හා පලතුරු නැවත වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රු. 200,000 ලබා දීම*
- *සත්ව පාලනයට සිදුවූ හානිය පදනම් කරගෙන දෙමුහුන් ගව පාලනය සඳහා උපරිමය ලක්ෂ 20 දක්වාද, දේශීය ගව පාලනය සඳහා උපරිමය ලක්ෂ දක්වාද සූකර පාලනය හා එළු/බැටළු පාලනය සඳහා උපරිම ලක්ෂ 4 දක්වාද, කුකුළු පාලනය සඳහා උපරිමය රු. ලක්ෂ 10 දක්වාද ලබා දීමට නියමිතයි.*
- *ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට රු. ලක්ෂ 2ක් ලබා දීම*
- *ආපදා තත්ත්වයන්ට ලක්වූ පාසැල් දරුවන්ට රු. 25,000 ක දීමනාවක් ලබා දීම*
- *කරදිය ධීවර කර්මාන්තයේ සම්පූර්ණයෙන්ම විනාශ වූ බෝට්ටු සහ දැල් ලබා ගැනීම සඳහා වන්දි ලබා දීම*
- *අර්ධ හානි බෝට්ටු අලුත්වැඩියා කර දීම*
- *දැල් මිලදී ගැනීම සඳහා රු. ලක්ෂයක් ලබාදීම*
- *මිරිදිය කර්මාන්තයේ සම්පූර්ණයෙන් හානි වූ ඔරුවක් සඳහා රු. ලක්ෂයක්ද, අර්ධ හානි වූ ඔරු අළුත්වැඩියාව, දැල් මිලදී ගැනීම සඳහා රු. 75,000ක්ද ලබා දීම*
- *හානියට පත්වූ ස්ථිර ව්‍යාපාරික ගොඩනැගිලි සඳහා හානි තක්සේරුවකින් පසුව උපරිමය රු. ලක්ෂ 50 දක්වාද හානි තක්සේරුවකින් තොරව රු. ලක්ෂ 5ක දීමනාවක්ද, අර්ධ වශයෙන් හානිවූ නිවසක් වෙනුවට නව නිවසක් ඉදිකිරීම සඳහා ලක්ෂ 50 ලබා දීම*
- *අර්ධ හානි වූ නිවාස පිළිසකර කිරීම සඳහා තක්සේරුවකින් පසුව උපරිමය ලක්ෂ 25ක්ද, තක්සේරුවකින් තොරව රු. ලක්ෂ 5ක් ද ගෙවීම අනුමත කර තිබෙනවා.*

*නැවත ගොඩනැගීමේ මූල්‍ය මැදිහත්වීම මෙසේ සිදුකරනු ලබනවා. මේ අභියෝගයට මුහුණදීමේ දී ප්‍රධාන අරමුණ බවට පත්වන්නේ ආපදාවකට ලක්වූ කිසිදු පුද්ගලයෙකු අත් නොහැර පෙර තිබූ තත්ත්වයට වඩා යහපත් ජීවන තත්වයක් සහිත ශ්‍රී ලංකාවක් නැවත ගොඩනැංවීමයි.*

***මේ වැඩපිළිවෙළ හමුවේ පවතින ප්‍රධාන අභියෝග මොනවාද?***

*අවතැන් වූ පුද්ගලයන්ගේ නිවාස නැවත සකස්කර දීමට පෙර ජීවත්වීම සඳහා තාවකාලික ස්ථාන සොයාදීම පිළිබඳ ප්‍රායෝගික ගැටලු තිබෙනවා. ඒ වගේම නැවත පදිංචි කිරීමේදී බොහෝ ඉදිකිරීම් අනවසර හා නාය යෑම්වලට ලක්වන අවදානම් කලාපවල පිහිටි ඉඩම් සඳහා නැවත අනතුරු සිදු නොවන අවදානම් පෙදෙස් නොවන නව ස්ථාන සොයා දිය යුතු වෙනවා. මුදල් වියදම් කිරීමේදී ඊට අදාළ රාජ්‍ය නිලධාරීන් සිය දෛනික රාජකාරී අතරතුර මෙම කාර්යයන් සිදු කළ යුතු වීමත් එහිදී අදාළ ක්ෂේත්‍රවල පුහුණුව ලත් පුද්ගල හිඟය හා තාක්ෂණික ගැටලුවලට මුහුණ දීමට සිදුවීමත් දැකිය හැකියි. ඒ වගේම අරමුණු සහගතව නැවත ගොඩනැගීමට බාධා පමුණුවන ඇතැමුන්ගේ දුර්මත පැතිරවීමත් අභියෝග වශයෙන් පෙන්වා දිය හැකියි.*

*ආපදාවට පත්ව සිටින ජනයාට ආණ්ඩුව විශාල සහන පැකේජයක් අනුමත කළා. ඇතැම් අය පවසන්නෙ මෙතරම් විශාල පැකේජයක් අපේ ආර්ථිකයට දැරිය නොහැකි බවයි?*

*මහජනතාව ගැන හෝ මනුෂ්‍යත්වය පිළිබඳ නොසලකා හරින ආණ්ඩුවකටනම් මෙය දැරීමට නොහැකි බරක් තමයි. නමුත් ජාතික ජනබලවේගය ආණ්ඩුව මහජනතාව වෙනුවෙන් ඔවුන්ට පොහොසත් රටක් ලස්සන ජීවිතයක් අත්පත් කරදීමේ ව්‍යායාමයට මැදිහත් වූ ආණ්ඩුවක්. එම නිසා එය කිසිසේත්ම දැරිය නොහැකි බරක් නෙමෙයි. එමෙන්ම මෙම කාර්යයේදී ලාංකේය මෙන්ම විදේශීය ශ්‍රී ලාංකිකයින්ගෙන් ලද ආධාර මෙන්ම විවිධ රාජ්‍යන්ගෙන් ලද සහයෝගය, අප වෙත දුන් ධෛර්යය පිළිබඳ ස්තුතිවන්ත විය යුතුව තිබෙනවා.*

***Rebuilding Sri Lanka අරමුදල බලාපොරොත්තු වෙන ඉලක්කවලට යන්න පුළුවන්ද?***

*Rebuilding Sri Lanka අරමුදල බලාපොරොත්තු වන ඉලක්කයට අනිවාර්යෙන්ම යා හැකියි. නමුත් එය ක්ෂණිකව කළ හැකි දෙයක් නොව පියවරෙන් පියවර ක්‍රමානුකූලව කළ යුතු දෙයක්. එය වසර දෙකක් හෝ තුනක් අතර කාලයක් තුළදී අප බලාපොරොත්තු වන මට්ටමින්ම සිදු කළ හැකියි.*

*අවතැන්වූ අනාරක්ෂිත ප්‍රදේශවල සිටි ජනතාව සම්බන්ධ ඉදිරි සැලසුම් මොනවාද?*

*අවතැන්වූ ජනතාව නැවත සුරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කරවීම තමා මූලිකම අරමුණ. ඒ සඳහා විපතට පත් පුද්ගලයන් සතුව ආරක්ෂිත ස්ථානයක ඉඩමක් පවතීනම් එහිද, ඔවුන්ට ඉඩමක් නොමැතිනම් අවදානම් රහිත පෙදෙස්වල භූවිද්‍යා සාධක සැලකිල්ලට ගනිමින් පොකුරු නිවාස සංකල්පය ක්‍රියාත්මක කිරීමටත් ඔවුනට රැකියා අවස්ථා සොයාදීමත් සිදු කරනවා.*







## YES WE CAN

# මෙසේ කළ හැක්කේ ජනතාවාදී ආණ්ඩුවකට පමණය!...

දිත්වා සුලි කුණාටුවෙන් වුණු විනාශය සුළුපටු නොවේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්තාවලට අනුව 639 දෙනෙකු මියගොස් 210 දෙනෙකු තවමත් අතුරුදන්ව ඇති විශාල විනාශයකි. ලෝක බැංකු වාර්තා වලට අනුව සෘජු භෞතික හානිය ඩොලර් මිලියන 4100 කි. සමස්ත ආර්ථික හානිය ඩොලර් මිලියන 6000 -7000 ත් අතර විය හැකි බව අනුමාන කරයි. විනාශයේ තරම එබඳුය.

යටිතල පසුකම් නැවත ගොඩනැගීමට 2028 තෙක් ඇදී යන බව බොහෝ පුරෝකථනයන් පෙන්වා දෙයි. පුරෝකථන එසේ වුවද, විනාශ වූ යටිතල පහසුකම් සංවර්ධනට තාවකාලික විසඳුම් ලබාදීමටත්, ජන ජීවිතය යථා තත්ත්වයට පත්කරගැනීමටත්, ක්‍රියාත්මක වූ ජනතාවාදී ආණ්ඩුව ජාත්‍යන්තර සහයෝගය හා මහජන ස්වේච්ඡා ශ්‍රමය සමග එක්ව 75%ක වැඩ කොටසක් මේ වන විට අවසන් කර ඇත. මාර්ග හා පාලම් 80%ක්, විදුලි බලය 90%ක්, ජල සැපයුම් 75%ක්, සෞඛ්‍ය හා හදිසි සේවාවන් 90% ට වැඩි ප්‍රමාණයක්, පාසල් හා රජයේ පොදු ස්ථාන 60%ට වැඩි ප්‍රමාණයක් කුණාටුවෙන් මසක් ගතවන්නටත් පෙර අවසන් කර සැබෑ ජනතාවාදී ආණ්ඩුවක භූමිකාව ඉටු කර ඇත.

"මිනිස්සුන්ට මෙහෙම දෙන්න ඕනද?" "එච්චර හානියක් වෙලා නෑනේ?" "වතුර ටිකක් ආවට 25,000ක් දෙන්න ඕනද?" "ඇයි ගෙවල් කුලී දෙන්නෙ?" "මේවා හැම මාස් කන්නයේම යට වෙනවා මහත්තයෝ, අපිම තමා හෝදගත්තෙ"

මෙවැනි සමාජ කථිකාවන් තුළ, පීඩාවට පත් ජනතාව නැවත නගාසිටුවීම වෙනුවෙන් සිදු කළ වේගවත් මැදිහත්වීම පසක් කළේය. විනාශය සිදු වී සති දෙකක් තුළ රු.බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගන්නේ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් බිලියන 250ක් හා විනාශ වූ නිවාස ආධාර ලබාදීම වෙනුවෙන් බිලියන 100ක් හා ජීවන තත්වය නගාසිටුවීම වෙනුවෙන් බිලියන 150 ක් ලෙස වෙන් කරමිනි.

මෙසේ වෙන්කරවාගත් මුදල් ඉතා කාර්ක්ෂම ලෙස ජනතාව අතට පත්කරවීම වෙනුවෙන් වේගවත් මැදිහත් වීමක් සිදු කරමින් දෙසැම්බර් මස 30 වන විට සමස්ත සහනාධාර හා වන්දි ලබාදීම 70%ක් ඉක්මවා ලබාදී ඇත. හදිසි සහන ලෙස ලබාදුන් වියලි සලාක හා ආහාර, අවතැන් කඳවුරුවල සිටි පුද්ගලයෙකුට දිනකට රුපියල් 600ක් මෙන්ම සතියකට අවශ්‍ය වියලි සලාකයක් වෙනුවෙන් පුද්ගලයෙකුට රුපියල් 1200 ක් ලෙස ආසන්න වශයෙන් රු.මි.2000ක් ලබා දී ඇත.

එසේම නිවාස පිරිසිදු කරගැනීම වෙනුවෙන් නිවසකට 25,000ක්, පූර්ණ නිවාස හානි සඳහා නිවසකට ලක්ෂ පනහක් 5,000,000ක් හා අර්ධ නිවාස හානි සඳහා නිවසකට ලක්ෂ විසිපහක් 2,500,000ක් ලෙස ලබා දීමට කටයුතු කර ඇත. තාවකාලික නිවාස කුලී ලෙස නිවසකට මාස 3-6 කාලයක් රුපියල් 25,000ක්ද ලබාදීමට තීරණය විය. විනාශ වූ පාසල් උපකරණ ලබාගැනීම වෙනුවෙන් එක් දරුවෙකුට රු.15,000 බැගින් ලබා දීමටද කටයුතු කළේ ඉහත සමාජ කථිකාව හා විශ්මය තවත් ඉහළ නංවමිනි. එයට ජනාධිපති අරමුදල මගින් තවත් රු. 10,000ක් එකතු කරනු ඇත.

වගා හානි වෙනුවෙන් වී ගොවිතැනට හෙක්ටයාරයකට රු.150,000 බැගින්, එළවළු වගාවන්ට හෙක්ටයාරයකට රු.200,000 ක් ලෙස හා පශු සම්පත් හානි වෙනුවෙන් 200,000 සිට ද, ධීවර කර්මාන්තයේ හානි වෙනුවෙන් 400,000 සිටද හානිය පත් ව්‍යාපාර වෙනුවෙන් ලක්ෂ 50 දක්වාද වන්දි ලබාදීමට කටයුතු කර ඇත.

තමා පිළිබඳ සංවේදී ආණ්ඩුවක් අපේක්ෂා කළ ජනතාවට සැබෑ ජනතාවාදී ආණ්ඩුවක ආදර්ශය මෙම අභියෝගාත්මක අවස්ථාවේ රජයේ මැදිහත්වීම් මත මනාව පිළිබිඹු වී තිබේ.

# පෞද්ගලික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන තාරුණ්‍යය

පසුගියදා ශ්‍රී ලංකාව මුහුණ පෑවේ මෑත ඉතිහාසයේ මුහුණ දුන් දරුණුතම ස්වභාවික ආපදාවටය. එය රටේ දිස්ත්‍රික්ක කිහිපයක් හැර සෙසු සියලු දිස්ත්‍රික්කවලට බලපෑවේය. එම තත්වයට මුහුණ දීම වෙනුවෙන් මුළු රටේම ජනතාව එකට එක්වූ ආකාරය අපි දුටුවෙමු. මෙම නිශ්චිත අවස්ථාවේ තරුණ තරුණියන්ගේ සක්‍රීය දායකත්වය ආපදා කළමනාකරණය වෙනුවෙන් ලබාදුන් ආකාරය පැසසුමට ලක්විය යුතුය. එහිදී මෙරට තාරුණ්‍යය වෙනුවෙන් වූ ප්‍රධානතම රාජ්‍ය ආයතනය වන ජාතික තරුණ සේවා සභාවේ යූත් ක්ලබ් ජාතික සම්මේලනය, සමාජවාදී තරුණ සංගමය වැනි ස්වේච්ඡා තරුණ සහභාගිත්වය වැඩි තරුණ සංවිධාන මෙන්ම රටේ පොදු තාරුණ්‍යය මේ මොහොතේ විශිෂ්ට මැදිහත්වීමක් සිදු කළේය.

නොවැම්බර් 28 වැනිදා උදෑසන වන විට ගංවතුර හා නායයාම් හේතුවෙන් ජනතාව පීඩාවට පත්ව ඇති බවට සැලවූ සැණින් ක්‍රියාත්මක වූ මෙරට තාරුණ ප්‍රජාව තමන්ට වඩාත් සමීප කවයන් තුළ එක්රැස් වීම ආරම්භ කළෝය. තරුණයින් වෙනුවෙන් වූ ප්‍රධාන රාජ්‍ය ආයතනය වන ජාතික තරුණ සේවා සභාව, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය සමග එක්ව ආපදා සහන සේවා මධ්‍යස්ථානයට අත්‍යාවශ්‍ය භාණ්ඩ ලබාදීමේ වැඩපිළිවෙළක් සකස් කළේය. ඒ සඳහා සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන්ද එක්වෙමින්, පුළුල් ප්‍රචාරනයක් ලබාදෙමින් පීඩාවට පත්ව සිටින ජනතාව වෙනුවෙන් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය රැස් කිරීම ආරම්භ කර තිබුණි.

එය සැල වූ වහාම ජාතික තරුණ සේවා සභාවට තරුණ තරුණියන් රැස්වන්නට පටන් ගත්තෝය. ඔවුන් තමන්ට කරන්න ඇති වැඩ පිළිබඳව සොයා බලමින් ඉදිරිපත් වෙමින් හා සහයෝගයෙන් එම කටයුතු කරනු අපි දුටුවෙමු. එකිනෙකා නොහඳුනන, නමුත් එකම රටක මිනිසුන් යන හැඟීමෙන් යුතුව ඔවුන් විසින් වැඩ අරඹා තිබුණි. පිරිසක් ජනතාව ගෙනවිත් දෙන භාණ්ඩ භාරගැනීම කළ අතර, පිරිසක් ඒවා ශාලාව වෙත රැගෙන යාම කළහ. තවත් පිරිසක් එම භාණ්ඩ වර්ගීකරණය කළ අතර, තවත් පිරිසක් ඒවා ලේඛනගත කළේය. කවුරුන් හෝ වැඩ පවරන තුරු නොසිට ඔවුහු තමන් විසින් පවරා ගත් වගකීම්වල හා වැඩෙහි නිරත වූහ. ඒ තරුණ සේවා සභාව තුළය.

ඉන් පිටත ද තවත් දහස් සංඛ්‍යාත, ලක්ෂ සංඛ්‍යාත තරුණ තරුණියෝ විවිධ තැන්වල සිය ස්වේච්ඡා දායකත්වය ලබාදුන්හ. සමාජවාදී තරුණ සංගමය ආපදාවට ලක්ව නිවෙස් තුළ සිරව සිටි ජනතාව ඉන් මුදවා ගෙන මධ්‍යස්ථාන වෙත රැගෙන යාම, පසු ආපදා තත්වයන්ට මුහුණ දීමට ජනතාවට සහය වීම වෙනුවෙන් ස්වේච්ඡාවෙන් මැදිහත් විය. එයින් නොනැවතී ඔවුන්ට ආහාර ලබාදීම, අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම පිළිබඳව යුහුසුළුව මැදිහත් වනු පෙනුණි.

සිය රාජකාරියට එහා ගිය වගකීමක් පවරා ගනිමින් අත්‍යාවශ්‍ය සේවාවන්හි නිරත තරුණ තරුණියන්, විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවන්හි සේවයේ නියුතු තරුණයින් සිය ජීවිතය පිළිබඳව පවා නොසිතමින් විපතට පත් ජනතාව වෙනුවෙන් සිය මෙහෙවර ඉටු කරනු දුටුවෙමු.

තරුණ වෛද්‍යවරු ස්වේච්ඡවෙන් ඉදිරිපත්ව ළඟා වීමට අපහසු ස්ථානවලට පවා යමින් ගංවතුර හා නායයාම් හේතුවෙන් පීඩාවට පත්ව සිටි ජනතාවට සුවසෙත සැලසූහ. තමන්ට හැකි සෑම අයුරකින්ම මෙම මොහොතේදී මෙරට තරුණ ප්‍රජාව සිය මැදිහත් වීම උපරිම අයුරින් ඉටු කළහ; තවමත් ඉටු කරමින් සිටිති.

එම මැදිහත් වීම තවදුරටත් පුළුල් කරමින් 'වන් මිලියන් වොලන්ටියර්' නමින් වැඩසටහනක් ආරම්භ කර ඇති අතර, ඒ සඳහා ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇත. රටේ සංවර්ධනයට හා මෙවැනි ආපදා තත්වයන්වලදී විධිමත් ලෙස ස්වේච්ඡා තරුණ දායකත්වය ලබාගැනීම වෙනුවෙන් වන් මිලියන් වොලන්ටියර් ප්‍රවේශයකි. මේ වන විට මෙරට තරුණ තරුණියන් සීඝ්‍රයෙන් එහි ලියාපදිංචි වෙමින් සිටියි. එහි පළමු හා දෙවන කණ්ඩායම් දෙකක් මේ වන විට පුත්තලම හා බදුල්ල දිස්ත්‍රික්කවල ශ්‍රම මෙහෙයුම් කටයුතු අවසන් කළ අතර, එයින් පෙන්නුම් කරනුයේ මෙරට තාරුණ්‍යය සාමූහිකව, පුද්ගලික ප්‍රතිලාභ අපේක්ෂා රහිතව හා රට වෙනුවෙන් සිය ශ්‍රම දායකත්වය ලබාදීමට ඇති කැමැත්තය.



# ලබන්නා වූ සුබ නව වසර!...

එක් වසක් නිමව ගිය
මතකයන් මිටි කොට
බැඳුණු හදවත් පෙළින්
මහා සවියක් ව මෙබිමට...

අරුණලු ගෙනෙනා ප්‍රභාතය
උපදිනා අලුත් හිරු කිරණින්
නිල් පැහැයෙන් බබළන
මගේ දේශය
නව ප්‍රාණයක් ලැබ...
උදාවන නව ලොව
නව අදිටන් පොදි බැඳ
පෙළගැසෙමු අද
හදන්නට "හෙට"...


පහන් කොට හැම සිත්
හදවත් යා කරන
උතුරත් - දකුණත්
නැගෙනහිර - බටහිරත්
එකම රිද්මයක අවදිව...
යදම් පුපුරා නැගෙන
සුවහසක් දෑතින්
මහ පොළොව සිපගන්න
දහදියෙන් එක්කොට...

ගොඩනගන රිද්මයෙන්
නොබිඳෙන මහා ජන බලයක්
මනුදහම් රකිනා නිතින්
යෝධ වීරයයෙන්
අකම්පිත රතු පවුරක්..!



## හානියට පත් වූ සෛල පරිභෝජනය කරන මිනිස් සිරුර...

නිරාහාරව සිටින විට මිනිස් සිරුර තමන්ගේම හානියට පත් සෛල පරිභෝජනය කරන බව ජපන් ජාතික විද්‍යාඥ යොෂිනොරි ඕසුමි (Yoshinory Ohsumi) විසින් සොයා ගන්නා ලදී. මෙමගින් ලෝකයේ බොහෝ දෙනාගේ අවධානය යොමු වූයේ අපගේ ශරීරයට තනිවම සුවවීමේ සහ අලුත් වැඩියා වීමේ පුදුමාකාර හැකියාවක් පවතින බවයි. මෙම ක්‍රියාවලිය ලොවට හෙළිදරව් කිරීම නිසා 2016 වර්ෂයේදී වෛද්‍ය විද්‍යාව සඳහා වූ නොබෙල් ත්‍යාගය මෙම ජපන් විද්‍යාඥයා විසින් දිනාගන්නා ලදී. අප ගන්නා ආහාර ප්‍රමාණය සීමා කිරීම හෝ යම් කාල සීමාවක් නිරාහාරව සිටීමෙන් මෙම ක්‍රියාවලිය සක්‍රියවන බව මෙම විද්‍යාඥයා විසින් පෙන්වා දෙන ලදී. එම ක්‍රියාවලිය විද්‍යාත්මකව හඳුන්වනු ලබන්නේ ඔටෝෆජි (Autophagy) යනුවෙනි. ග්‍රීක භාෂාවෙන් බිඳී ආ මෙම වචනයේ සරල අර්ථය වන්නේ ණීතමන් විසින් තමන්ව අනුභව කිරීම▫ යන්නයි. මෙහි ප්‍රධානතම වාසිය වන්නේ වයසට යෑමේ ක්‍රියාවලිය ප්‍රමාද කිරීමයි. එමෙන්ම මොළය ආශ්‍රිතව හට ගන්නා ඇල්සයිමර් සහ පාකින්සන් වැනි රෝග වලට හේතුවන විෂ සහිත ප්‍රෝටීන තැන්පත් ඉවත් කිරීමටද මෙම ක්‍රියාවලිය උපකාරී වන බව පර්යේෂණ මගින් තහවුරු කර ඇත. එනම් නිරාහාරව සිටීම හුදෙක් බර අඩු කර ගැනීමට පමණක් නොව මොලයේ සෞඛ්‍යයටද එකසේ වැදගත් වේ.



## භෞතික විද්‍යාවෙන් ආචාර්ය උපාධියක් දිනා ගැනීමට සමත්වූ ළාබාලයා...

අප බොහෝ දෙනෙක් වයස අවුරුදු 15 දී සාමාන්‍ය පෙළ විභාගයට සූදානම් වෙද්දී, බෙල්ජියම් ජාතික ලෝරන්ට් සයිමන්ස් (Laurent Simons) ලෝකයම මවිත කරමින් භෞතික විද්‍යාවෙන් ආචාර්ය උපාධියක් දිනා ගැනීමට සමත්ව තිබෙනවා. ඇන්ට්වර්ප් විශ්වවිද්‍යාලයෙන් (University of Antwerp) මෙම උපාධිය දිනාගත් ඔහු, දැනට ලොව මෙම ක්ෂේත්‍රයෙන් ආචාර්ය උපාධියක් ලබාගත් ළාබාලතම පුද්ගලයන් අතරින් කෙනෙකි.

ඔහු සිය පාසල් අධ්‍යාපනය වයස අවුරුදු 8 දී අවසන් කළ අතර, වයස 12 වන විට භෞතික විද්‍යාව පිළිබඳ මූලික උපාධිය (Bachelor's degree) ලබා ගත්තා. ඔහු පර්යේෂණ සිදු කළ ක්වොන්ටම් භෞතික විද්‍යාව යනු ඉතා සංකීර්ණ ගණිතමය සිද්ධාන්ත පවතින විෂය පථයක් වුවත්, සාමාන්‍ය අධ්‍යයන ක්‍රියාවලියට අනුව ඉතා සාර්ථකව ඔහු තම නිබන්ධනය නිම කර තිබෙනවා.

ඔහුගේ මීළඟ ඉලක්කය වන්නේ වෛද්‍ය විද්‍යාව හැදෑරීම සහ කෘත්‍රිම බුද්ධිය (AI) වෛද්‍ය පර්යේෂණ සඳහා යොදා ගැනීමයි



# 'දිත්වා' කුණාටුව හා
# දේශපාලන අවතැන් වූවෝ



"විද්‍යාවේ හා ව්‍යවහාරයේ ප්‍රගතියෙන් ප්‍රයෝජන ගනිමින්, අපි ප්‍රදේශවල සැලසුම් නියමිත කලට මත්තෙන් සපුරා ගැනීමට නොපසුබට ලෙස උත්සාහ දැරිය යුත්තෙමු. කර්මාන්තය සම්පූර්ණයෙන්ම ප්‍රකෘතිමත් කිරීම අපෙන් වෙන් කරන දීර්ඝ කාලය ව්‍යවහාරයේදී අඩු කළ හැකි බව එවිට පොදු ජනතාවට වැටහෙන්නේය. එය අප මත රැඳී පවතින දෙයකි. සෑම කම්හලකම, සෑම දුම්රිය ඩිපෝවකම, සෑම ක්ෂේත්‍රයකම අපගේ වැඩ ක්‍රම වැඩි දියුණු කරමු. එවිට අපට මෙම කාලය කෙටි කළ හැකි වනු ඇත. අපි එය කෙටි කරමු. දීර්ඝ කාලීන සැලසුම් ගැන බිය නොවන්න. ඒවා නොමැතිව ඔබට ආර්ථික පුනර්ජීවනයක් උදාකර ගත හැකි නොවේ. සියලුම ප්‍රදේශවල අපගේ සියලුම ශක්තිය ඒවා සපුරාලීම සඳහා කැප කරමු."

**ලෙනින්**

**තෝරාගත් කෘති, වෙළුම 11, 120 පිටුව**

පසුගිය නොවැම්බරයේ අග ලංකාවට කඩා වැදුණු 'දිත්වා' සුළි කුණාටුව දින කිහිපයකට පසු දිවයිනෙන් බැහැරට ගියේ රටට විශාල හානියක් කරමිනි. මෙම සුළි කුණාටුව නිසා ඇති වූ නායයෑම් ගංවතුර වැනි හේතු නිසා මෙරට පුරවැසියන් 600කට වැඩි ප්‍රමාණයක් මිය ගිය අතර 200කට මඳක් වැඩි ප්‍රමාණයක් තවමත් අතුරුදහන් වූවෝ බවට පත්ව සිටිති. ඒ අතර රට පුරා දිස්ත්‍රික්ක 21ක පමණ ලක්ෂ ගණනක් ජනයා අවතැන් වූහ.

මේ කුණාටුව සිදු කළ ඉතා බරපතළ ව්‍යසනය තුළ ජනතාවට දේශපාලන ඇත්දැකීම් කිහිපයක්ද උගන්වා ඇත. මෙම ව්‍යසනය මැද්දේ වුව ඒවාද නිවැරදිව කියවා ගැනීම අනාගතය උදෙසා ප්‍රයෝජනවත්ය.



කුණාටුව පහරදීමත් සමග මාලිමා ආණ්ඩුව හා ජනාධිපති අනුර සහෝදරයා වහාම ක්‍රියාත්මක වූයේ හැකිතාක් අනතුරු අවම කර ගැනීම සඳහාය. වෙනත් කිසිදු පාලන කාලයක් තුළ මීට වඩා අඩු විපත්වලදී පවා අප නොදුටු වේගයකින් කාර්යක්ෂමභාවයකින් හා ජනතාව ගැන කම්පනයකින් වත්මන් ආණ්ඩුව මැදිහත් විය. මරණ සංඛ්‍යාව බොහෝ දුරට අඩුකර ගැනීමට එය හේතුවක් විය. කලාඔය බස්රථයක් වතුරට හසුවීම නිසා නිවසක වහලයක් මත රැඳී සිටි 60 ගණනක් මගීන් බේරා ගැනීම එක් උදාහරණයක් පමණි.

අනෙක් අතට මේ ව්‍යසනයෙන් පසු ජනතාවට සහන සැලසීම සඳහාද ආණ්ඩුව නිර්ලෝභීව මැදිහත් විය. මෙතෙක් ලංකා ඉතිහාසයේ ස්වභාවික විපතකදී ලබාදී ඇති විශාලතම සහන පැකේජය හා වන්දි ගෙවීම ප්‍රකාශයට පත්කිරීමට ආණ්ඩුව සමත් විය. එය හැමදෙනාම පුදුමයට පත්කරන්නක් විය. එසේම කැඩී බිඳී ගිය මංමාවත් යළි පිළිසකර කිරීමේදී, කැඩුණු පාලම් තාවකාලිකව හෝ යළි පිළිසකර කිරීමේදී, බිඳ වැටුණු, විදුලිය, දුරකථන පහසුකම් හා ජලය ලබාදීමේදී ආණ්ඩුවේත් එම අමාත්‍යාංශයන් හා නිලධාරීන්ගේත් වේගවත් මැදිහත් වීම පැසසිය යුතුය. කැඩුණු වැව් හා ජලාශ යළි පිළිසකර කිරීමද මෙයට අයත්ය.

විපක්ෂයේ විවිධ බාධා කිරීම් හා පොදු ජනයා නොමග යැවීමට ගත් උත්සාහයන් මැද ආණ්ඩුව තම වගකීම ඉහළින්ම ඉටුකිරීමට සමත්ව තිබේ. එහිදී රටේ විවිධ සිවිල් සංවිධාන, පුද්ගලයන් පෞද්ගලික ආයතනවල මැදිහත් වීම ඊට විශාල පිටුවහලක් විය.

එසේම මෙම විපත සැලවූ වහාම ජාත්‍යන්තර ප්‍රජාව ලංකාවට ලබාදුන් සහාය හා මානුෂීය ආධාරද මිල කළ නොහැකි තරම්ය. ඉන්දියාව, චීනය, පකිස්ථානය, බංග්ලාදේශය, යුරෝපා සංගමය, එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, මැදපෙරදිග රටවල් ඇතුළු ජාත්‍යන්තර ප්‍රජාව තම තමන්ට හැකි පමණින් උදව් හා ආධාර කළ අතර, එහිදී ආණ්ඩුව කෙරෙහි ඔවුන් තබා ඇති විශ්වාසයත්, ජාත්‍යන්තර ප්‍රජාවගේ හොඳ හිත දිනාගැනීමට ආණ්ඩුව සමත්ව තිබීමත් සැලකිය යුතු වැදගත් කරුණක් විය.

ජනතා විමුක්ති පෙරමුණ හා ජාතික ජන බලවේග යේ සාමාජික සාමාජිකාවන් හා හිතවතුන්ගේ ස්වේච්ඡා මැදිහත්වීමද මෙහිදී සඳහන් කළ යුතුය. සියල්ල මෙසේ සිදුවෙද්දී ඊනියා විපක්ෂයේ හැසිරීම සිදුවූයේ කෙසේද? එය කිසිවිටෙක සාධාරණය කළ නොහැකි පොදු ජනයාගේ පිළිකුලට හා විරෝධයට ලක්වූ ඉතාම දුෂ්ට හා මන්දබුද්ධික හැසිරීමක් බව රටම පිළිගෙන අවසන්ය. සැබවින්ම 'දිත්වා' සුළි කුණාටුවෙන් දේශපාලනික වශයෙන් විශාල අවතැන්වීම සිදු වූයේ ඊනියා ඒකාබද්ධ විපක්ෂයටය.

විපක්ෂයට මෙසේ වූයේ ඇයි? 2024 ජනාධිපතිවරණය හා මහ මැතිවරණයෙන් පරාජයට පත්ව පතුළටම වැටුණු විපක්ෂය ඉන්පසු කටයුතු කළේ ඉවසීමෙන් සංයමයෙන් ජනතාව දිනාගැනීම සඳහා නොව කෝපයෙන්, වියරුවෙන් ආණ්ඩුවට අතට අසුවන දෙයින් පහර දීමටය. රට තුළ සිදුවූ දේශපාලන වෙනස කියවා ගන්නවා වෙනුවට විපක්ෂය කටයුතු කළේත්, තවමත් කටයුතු කරන්නේත් මනෝරාජික සිහින තුළ අතරමං වී යථාර්ථය ගැන අවබෝධයකින් තොරවය.

ආණ්ඩුවක් ජනතා විරෝධී ක්‍රියාමාර්ග ගන්නා විට විපක්ෂයක් එයට එරෙහිවීම දේශපාලනිකව නිවැරදිය. එවිට විපක්ෂය නියෝජනය කරන්නේ ජනතාවගේ වුවමනාවන්ය. එහෙත් ආණ්ඩුවක් ජනතාවාදී ක්‍රියාමාර්ග ගනිද්දී ආණ්ඩුවට කෙසේ හෝ විරුද්ධ විය යුතු නිසා විපක්ෂයක් ඊට විරුද්ධ වන විට ඔවුන් විරුද්ධ වන්නේ ආණ්ඩුවට පමණක් නොව ජනතාවටය. එවිට ජනතාවගේ විරෝධය විපක්ෂයට එල්ලවීම ස්වභාවිකය. පසුගිය වසරකට මඳක් වැඩි කාලය තුළ විපක්ෂය හැසිරුණේත්, විපක්ෂයට සිදුවූයේත් එයය. වතු කම්කරු ජනතාවට ආණ්ඩුවෙන් රුපියල් 200ක් දීමට ගත් තීරණයට විපක්ෂය විරුද්ධ වීම හා විපක්ෂයට එරෙහිව වතු කම්කරු ජනයා පාරට බැස උද්ඝෝෂණය කිරීම, මීට එක් උදාහරණයක් පමණි.

'දිත්වා' සුළි කුණාටුව අවස්ථාවේදී ද සුන්බුන් විපක්ෂයේ ඉහත හැසිරීම වෙනස් වූයේ නැත. මෙවැනි ස්වභාවික විපතකදී සියලු දෙනා එක්ව ජනයා එම විපතෙන් මුදා ගැනීමට කටයුතු කරනවා වෙනුවට සුන්බුන් විපක්ෂය උත්සාහ කළේ මෙම විපතේ වගකීම ආණ්ඩුව මත පටවා ජනතාව කුපිත කරවීමටය. කිසි තැනක නොවූ කාලගුණ අනාවැකියක් ගැන බොරු මතයක් පැතිරවීමට ඔවුන් උත්සාහ කළේ බොරදියේ මාළු බෑමේ උපක්‍රමයක් තුළය. ඒ ආණ්ඩු විරෝධී පුවත් මැවීමටය. මිනිසුන් මිය යාම, තව තවත් විපත් වැඩිවීම, ඔවුන් මුදා ගැනීමට නොහැකි වීම විපක්ෂයේ ප්‍රාර්ථනා තුළ තිබූ බව ඉතා පැහැදිලිය. ඔවුන් එසේ ප්‍රාර්ථනා කළේ මරණ තුළින්, විපත් තුළින් තමන්ට බලය ලබා ගත හැකිය යන දුෂ්ට, නරුම හා මනෝරාජික මනසින් නිසාය.

ජනතාවට සහන සැලසීමට කිසිවක් නොකළ, ඒ වෙනුවෙන් තම සාමාජිකයන් කිහිපදෙනෙක් හෝ මෙහෙයවීමට කටයුතු නොකළ විපක්ෂය දිගටම සිදු කළේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ගවල බොරු වැරදි සෙවීම හා ජනතාව කුපිත කළ හැකි දැයි උත්සාහ කර බැලීමය. එහෙත් ඒවා අසාර්ථක විය. සැබැවින්ම මේ විපතේදී අසාර්ථකම වූයේ විපක්ෂයය. සජිත්ට බලය හිමි ගම්පොළ නගර සභාවේ සභාපතිවරයාට මහජන විරෝධය නිසා සැඟවීමට සිදුවූයේ නගරයේ කසළ ටික පවා ඉවත් කිරීමට අපොහොසත් වූ නිසාය. අවසානයේ ගම්පොළ නගරය පිරිසිදු කළේ මාලිමා ආණ්ඩුව මැදිහත් වීමෙනි. පසුව එය නගරාධිපතිවරයා ප්‍රසිද්ධියේ පිළිගත්තේය.

කෙසේ වුවත් මේ සමස්ත ක්‍රියාවලිය අවසානයේ දැන් සිදුව තිබෙන්නේ සුන්බුන් විපක්ෂය ජනතාව අතරින් තව තවත් ප්‍රතික්ෂේප වීමය. මාලිමා ආණ්ඩුවට විරුද්ධව, එහි නායකයන්ට හා ක්‍රියාකාරිත්වයට එරෙහිව දවසක්වත් නොපවතින පොදු අවලාද නිර්මාණය කරමින් විපක්ෂය ගමන් කර ඇත්තේ ගොඩ ගත නොහැකි මඩ වළකටය. වෛරයට, කෝපයට, බොරුවට හා ඇමති ධුරවලට දේශපාලනය තුළ දිගුකල් ඉඩ නැත. සුන්බුන් විපක්ෂය දැන් මෙම සත්‍යය අත්දකිමින් සිටී.

අවසාන වශයෙන් තේරුම් ගත යුත්තේ ජනතාව අතරට යා හැකිව තිබූ අවස්ථාවක් (මේ ව්‍යසනය) වැරදි හා දුෂ්ට ක්‍රියාමාර්ග නිසා විපක්ෂය අහිමි කර ගෙන තිබෙන බවය. ඒ අනුව 'දිත්වා' සුළි කුණාටුවෙන් සැබවින්ම දේශපාලනික වශයෙන් අවතැන්ව ඇත්තේ සුන්බුන් විපක්ෂයය.

**ජනතාවට සහන සැලසීමට කිසිවක් නොකළ, ඒ වෙනුවෙන් තම සාමාජිකයන් කිහිපදෙනෙක් හෝ මෙහෙයවීමට කටයුතු නොකළ විපක්ෂය දිගටම සිදු කළේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ගවල බොරු වැරදි සෙවීම හා ජනතාව කුපිත කළ හැකි දැයි උත්සාහ කර බැලීමය. එහෙත් ඒවා අසාර්ථක විය. සැබැවින්ම මේ විපතේදී අසාර්ථකම වූයේ විපක්ෂයය.**




# සෝමාලිලන්තය ලෝක සිතියමට නව රටක් ලෙස එක්වීමේ සූදානමින්

සෝමාලියාව බෙදා වෙන්කර නව රටවල් 2ක් ලෝක සිතියමට එක් කිරීමේ උත්සාහය දශක කිහිපයක පටන් ක්‍රියාත්මක වේ. එලෙස බිහිකිරීමට උත්සාහ කරන එක් රටක් සෝමාලිලන්තය වන අතර අනෙක් රට පුන්ට්ලන්තයයි. මෙම අරමුණ ඉටුකරගැනීම වෙනුවෙන් සෝමාලියාවේ ඒ ඒ ප්‍රදේශ තුළ පවතින දේශපාලන ව්‍යාපාර වසර ගණනාවක් තිස්සේ උත්සාහ කරමින් සිටින අතර ඒ සඳහා විවිධ වූ ජාත්‍යන්තර සහයන්ද ලැබෙමින් පවතී.

මෙය නැවත ජාත්‍යන්තර දේශපාලන සාකච්ඡා තුළ ඉදිරියට පැමිණියේ පසුගිය දෙසැම්බර් 26 දින ඊශ්‍රායලය විසින් සෝමාලිලන්තය වෙනම ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගැනීමෙන් පසුවයි. ඒ අනුව සෝමාලිලන්තය යනු සෝමාලියාවෙන් වෙන් වූ වෙනම රටක් ලෙස පිළිගත්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය දරන ලොව ප්‍රථම රට වන්නේ ඊශ්‍රායලයයි. විදෙස් මාධ්‍ය වාර්තා කර තිබූ අන්දමට ඊශ්‍රායල අගමැති බෙන්ජමින් නෙතන්යාහු ප්‍රකාශ කර තිබුණේ කෘෂිකාර්මික, සෞඛ්‍ය, තාක්ෂණ සහ ආර්ථික ක්ෂේත්‍ර සම්බන්ධව සෝමාලිලන්තය සමග සබඳතා හැකි ඉක්මනින් ආරම්භ කිරීමට සූදානම් බවය.

ජිබුටි සහ ඉතියෝපියාවට මායිම් වෙමින් සෝමාලියාවේ වයඹදිග ප්‍රදේශය පදනම් කරගත් සෝමාලිලන්තය වර්ග කිලෝමීටර් 176,120ක භූමියකින්ද, මිලියන 6.2ක ජනගහනයකින්ද යුක්ත වේ. ක්‍රි.පූ. 2500දී පමණ සෝමාලිලන්තය පුන්ට් භූමියට අයත්ව තිබූ බවත් එහි වැසියන් රත්‍රන්, ඇත්දළ, සතුන්, සුවඳකාරක ආදිය ඊජිප්තුව සමග වෙළඳාම් කළ බවත් පුරාණ ඊජිප්තු ලේඛනවල දැක්වේ. එමෙන්ම ග්‍රීක, රෝම අධිරාජ්‍ය සමයේ සක්‍රිය වෙළඳ මධ්‍යස්ථානයක් ලෙසද මෙම භූමිය පැවත ඇති බව සඳහන් වේ. අප්‍රිකාව, අරාබිය සහ ඉන්දියාව පදනම් කරගත් වෙළඳ ජාලයේ කේන්ද්‍රීය ස්ථානයක් ලෙස එකල මෙම භූමිය වැදගත් විය.

ක්‍රි.ව. 7-15 කාලයේ උතුරු අප්‍රිකානු භූමි ප්‍රදේශ ඉස්ලාම්කරණය වීමත් සමග සෝමාලිලන්ත භූමියේ එවකට සිටි ජනතාවගෙන් අති බහුතරයක් විසින් ඉස්ලාම් ආගම වැළඳගන්නා ලදී. 1884දී බ්‍රිතාන්‍යයන් විසින් මෙම භූමිය යටත් කරගැනීමෙන් පසුව 'සෝමාලිලන්තය' නමින් වෙනම පාලන ඒකකයක් ලෙස පවත්වාගෙන ගොස් තිබිණි. මීට පෙරද භූමියක් ලෙස සෝමාලිලන්තය යන නාමය භාවිතා කර තිබුණද නිශ්චිත භූමි සීමා සහිතව, ස්වාධීන පාලනයක් ලෙස සෝමාලිලන්තය ගොඩනැගුණේ මෙලෙස බ්‍රිතාන්‍යයන් විසින් වෙනම පාලන ඒකකයක් ලෙස පවත්වාගෙන යාම ඇරඹීමත් සමගය.

වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස පමණක් නොව රතු මුහුදේ බලය පවත්වාගැනීමේ කේන්ද්‍රස්ථානයක් ලෙසද සෝමාලිලන්තය බ්‍රිතාන්‍යයන්ට වැදගත් විය. එකල බ්‍රිතාන්‍ය යටත්විජිතකරණයට එරෙහිව දීර්ඝතම කාලයක් (1899-1920 දක්වා) අඛණ්ඩව ජාතික විමුක්ති අරගලයක නිරත වූ අප්‍රිකානු භූමියක් ලෙසද සෝමාලිලන්තය ඉතිහාසගතව ඇත.

1960 ජූනි මස 26 සෝමාලිලන්තය බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලැබූ අතර එම වසරේම ජුලි 01 දින පැරණි ඉතාලියානු සෝමාලියාව සමග එක්ව සෝමාලියා ජනරජය පිහිටුවා ගැණිනි. (1889 සිට ඉතාලිය විසින් පාලනය කරන ලද සෝමාලියා භූමිය දෙවන ලෝක යුද්ධය සමග 1941දී බ්‍රිතාන්‍යයන් යටතට පත්විය. එතෙක් බ්‍රිතාන්‍ය සෝමාලිලන්තය සහ ඉතාලියානු සෝමාලියාව ලෙස මෙම කලාප වෙන්කර හඳුනා ගැනිණි. පෙර ඉතාලිය විසින් පාලනය කරන ලද භූමිය එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1950දී නැවත ඉතාලි පරිපාලනය යටතට පවරන ලදී. 1960 ජුලි 01 එක් වූයේ මෙම භූමීන් ද්විත්වයයි.)

කෙසේ නමුත් මෙම එක්වීම විශේෂ සම්මුති ආදී කිසිවක් සමග සිදුවූවක් නොවේ. එම නිසා සෝමාලියාවේ දකුණු ප්‍රදේශය පදනම් කරගනිමින්, මොගඩිෂු අගනුවර කරගනිමින් බිහිවූ පාලනය එතෙක් බ්‍රිතාන්‍ය සෝමාලිලන්තයේ ආධිපත්‍ය හෙබවූ ඉෂාක් වංශ සාමාජිකයින්ගේ ආධිපත්‍ය බිඳදැමීමක් විය. (ඉෂාක් වංශය සෝමාලිලන්තයේ එතෙක් ආධිපත්‍යය හෙබ වූ වංශය විය.) එමෙන්ම සෝමාලියානු පාලනයේ සමහර ක්‍රියාමාර්ග ඉෂාක්වරුන්ට එරෙහිව හිතාමතා ගෙන එන ඒවා බවට ඔවුන්ගෙන් චෝදනා එල්ල විය. 1969 සිදුවූ හමුදා කුමන්ත්‍රණයත් සමග සෝමාලියාව මිලිටරි පාලනයකට නතුවිය.

1977-78 කාලයේදී සෝමාලියාව විසින් ඉතියෝපියාව ආක්‍රමණය කළද කියුබානු හමුදා සහ සෝවියට් දේශයේ යුද විශේෂඥයින්ගේ සහය සහිතව සෝමාලියාව පරාජය කිරීමට ඉතියෝපියාවට හැකි විය. දහස් ගණනක ජීවිත නැතිකරමින්, සෝමාලියානු ආර්ථිකය බිඳවට්ටමින් පැවති විනාශකාරී යුද්ධය නිසා සෝමාලියාව තුළ දේශපාලන අර්බුදයක් උද්ගතවිණි. වර්ධනය වූ තත්වයන් හමුවේ සෝමාලියානු ජාතික ව්‍යාපාරයේ නායකත්වය සහිතව සෝමාලිලන්තය සෝමාලියාවෙන් වෙන්වීම පදනම් කරගනිමින් යුද්ධයක් ආරම්භ කරන ලදී. ඉතියෝපියාවේ එවකට පැවති සමාජවාදී පාලනය විසින්ද සෝමාලියානු ජාතික ව්‍යාපාරයට සිය සහය ලබාදෙන ලදී. 1981 අප්‍රේල් 06 ඇරඹි ගරිල්ලා යුද්ධය මර්දනය කිරීම උදෙසා සෝමාලියා ආණ්ඩුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග හේතුවෙන් සෝමාලිලන්ත භූමිය දැවැන්ත විනාශයකටද ලක්විය.

දස වසරක් මුළුල්ලේ පැවති මෙම යුද්ධය අවසන් වූයේ 1991 මැයි මස 18 දින සෝමාලියා ජාතික ව්‍යාපාරය විසින් සෝමාලිලන්තය නිදහස් රාජ්‍යයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමත් සමගිනි. එහෙත් එය ස්වාධීන රාජ්‍යයක් ලෙස ලොව අනෙකුත් රටවල් විසින් පිළිගනු නොලැබිණි. නමුත් බ්‍රිතාන්‍ය, එක්සත් ජනපදය, ජිබුටි, කෙන්යාව, තුර්කිය, ඉතියෝපියාව, තායිවානය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය ආදී රටවල් කිහිපයක් සිය රාජ්‍යතාන්ත්‍රික කාර්යාල සෝමාලිලන්තයේ පවත්වාගෙන යන ලදී. (මේවා කිසිවක් තානාපති කාර්යාල හෝ මහකොමසාරිස් කාර්යාල ලෙස හඳුන්වා නොදෙන අතර නියෝජිත කාර්යාල හෝ කොන්සියුලර් කාර්යාල ලෙස නම් කර ඇත.)

1991-93 දක්වා සෝමාලියානු ජනතා ව්‍යාපාරයේ නායක අහමද් අලි සෝමාලිලන්තය පාලනය කළ අතර 1993-2002 දක්වා පාලකයා ලෙස මොහොමඩ් හාජි ඉබ්‍රාහිම් වංශ නායකයින් එක්ව තෝරා පත්කරගන්නා ලදී. 2001දී ජනමත විචාරණයක් මගින් සෝමාලිලන්තය නව ව්‍යවස්ථාවක් සම්මත කරගන්නා ලදී. ඉන් අනතුරුව 2002 දී ප්‍රථම පළාත් පාලන ආයතන ඡන්දය, 2003දී ප්‍රථම ජනාධිපතිවරණය සහ 2005දී ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන ලදී. එතැන් සිට අද දක්වා සෝමාලිලන්තය මැතිවරණ මගින් පාලකයින් තෝරාගන්නා ව්‍යවස්ථාවක්, දේශසීමාවක්, හමුදාවක් සහිත වෙනව පාලයක් ලෙස ක්‍රියාත්මක වෙමින් ඇත.

කෙසේ නමුත් එක්සත් ජාතීන්ගේ සංවිධානය අදටත් පිළිගනු ලබන්නේ සෝමාලියාව ලෙස 1960දී වෙන්කර දෙන ලද දේශ සීමා පමණි. එම නිසා සෝමාලිලන්තය යනු වෙනම රටක් නොව සෝමාලියාවට අයත් භූමියක් ලෙස එක්සත් ජාතීන් විසින් අදටත් පිළිගනු ලබයි. සෝමාලිලන්තය වෙනම රටක් ලෙස පිළිගැනීම සම්බන්ධව අප්‍රිකානු සංගමයේ පවතින දැඩි විරෝධයද එම තීරණයට හේතු වී ඇත. අප්‍රිකානු සංගමය සිතන්නේ සෝමාලිලන්තය වෙනම රටක් ලෙස පිළිගැනීම සමස්ත අප්‍රිකානු කලාපයටම තර්ජනයක් විය හැකි බවයි. එමෙන්ම මේ මගින් අප්‍රිකානු කලාපයේ අනෙකුත් බෙදුම්වාදී ව්‍යාපාර ශක්තිමත් විය හැකි බවට වන පුරෝකථනයද මෙම තීරණයට හේතු වී ඇත. ඒ අනුව කලාපය තුළ බෙදුම්වාදී ව්‍යාපාරයන්ගේ ක්‍රියාකාරිත්වයක් සහිත රටවල් සියල්ල පාහේ සෝමාලිලන්තය වෙනම රටක් ලෙස පිළිගැනීමට දැඩි ලෙස විරුද්ධත්වය ප්‍රකාශ කර ඇත.

එක්සත් ජනපදය සෝමාලිලන්තය සෝමාලියාවේ කොටසක් ලෙස මෙතෙක් ප්‍රකාශ කළද සිය නියෝජිත කාර්යාලයක් සෝමාලිලන්තයේ පවත්වාගෙන යමින් සිටී. ඒ මගින් ආර්ථික, ආරක්ෂක ගනුදෙනු සිදුකරමින් සිටියි. යුරෝපා සංගමය සෝමාලිලන්තය සමග ගනුදෙනු සිදු කළද එය සෝමාලියාවට අයිති භූමියක් බවට පෙනී සිටියි. චීනය, සෝමාලිලන්තය වෙනම රටක් ලෙස පිළිනොගන්නා අතර සෝමාලිලන්තය තායිවානය වෙනම රටක් ලෙස පිළිගෙන තිබීම තවදුරටත් ප්‍රතිවිරෝධය වර්ධනය කරන්නක් වී ඇත. රුසියාවද පෙනී සිටින්නේ සෝමාලියාව වෙනුවෙනි.

මෙවන් තත්වයක් තුළ ඊශ්‍රායලය සෝමාලිලන්තය වෙනම ස්වාධීන රාජ්‍යයක් බව ප්‍රකාශ කිරීම සෝමාලියාවේ දැඩි දෝෂදර්ශනයට ලක්ව ඇති අතර ඊශ්‍රායලයේ ප්‍රකාශය වහා ඉල්ලා අස්කරගත යුතු බව ප්‍රකාශ කර ඇත. අප්‍රිකානු සංගමය පවා ඊට එරෙහිව සිය මතය ප්‍රකාශ කර ඇත. ඊශ්‍රායලයේ තීරණය අනුව යමින් සෝමාලිලන්තය ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගැනීමට තමන් අදහස් නොකරන බව එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් පවසා ඇත. මේ සම්බන්ධයෙන් චීනය අදහස් පළ කර තිබුණේ ජාත්‍යන්තර නීතියට යටත්ව සියලු රටවල් කටයුතු කළ යුතු බවටයි. ඉන් අදහස් කර තිබුණේ ජාත්‍යන්තර නීතියට අනුව සෝමාලිලන්තය ලෙස නව රාජ්‍යයක් හඳුනාගැනීම නිවැරදි නොවන බවයි. මැදපෙරදිග ඉස්ලාමීය රාජ්‍ය ගණනාවක් ඊශ්‍රායලයේ ප්‍රකාශයට සිය විරෝධය පළ කර තිබිණි. යේමනයේ හූති සන්නද්ධ සංවිධානය පවසා තිබුණේ ඊශ්‍රායලයේ මෙම ක්‍රියාව අනුමත නොකරන බවත්, කිසි ලෙසකින් හෝ සෝමාලිලන්තය තුළ ඊශ්‍රායල් රාජ්‍යතාන්ත්‍රික ක්‍රියාකාරිත්වයක් දුටුවහොත් එය සිය යුද ඉලක්කයක් වනු ඇති බවය.

## බංගලාදේශය : යළි ඇවිලේ



පසුගිය කාලයේ බංගලාදේශයේ පැනනැගුණු ජනතා නැගීසිටීම්වල ඉදිරිපෙළ සිටි තරුණ ක්‍රියාකාරිකයෙක් වූ ශරීෆ් ඔස්මන් හාදි ඝාතනය කිරීමත් සමග එරට පුරා නැවතත් ප්‍රචණ්ඩකාරී නැගීසිටීම් සිදුව තිබේ. එහිදී ප්‍රධාන මාධ්‍ය ආයතන දෙකක් සම්පූර්ණයෙන් ගිනිතබා විනාශ කිරීම ඇතුලුව තවත් දේපල හානි මෙන්ම පුද්ගල ඝාතන ගණනාවක් ද සිදුව තිබේ.

අන්තර්කාලීන ආණ්ඩුව විසින් එළඹෙන වසර ආරම්භයේ පාර්ලිමේන්තු මැතිවරණයක් කැඳවා තිබියදී මෙම තත්වය නිර්මාණය වී ඇති අතර විවිධ දේශපාලන කණ්ඩායම් සිය මැතිවරණ ඉලක්ක වෙනුවෙන් මෙම සිදුවීම් භාවිතා කරමින් සිටින බව නිරීක්ෂණය කල හැක. ඔස්මන් හාදි ද එම මැතිවරණය සඳහා ස්වාධීනව තරඟ කිරීමට බලාපොරොත්තුවෙන් සිටි අයෙකි.

## බෙලරුසියාව - රුසියන් මිසයිල ස්ථානගත කරයි



රුසියාවට අයත් ඔරිෂ්නික් මිසයිල පද්ධති තම රට තුල ස්ථානගත කිරීමට ඉඩ ලබාදුන් බවත්, මේ වන විට ඒවා ක්‍රියාත්මක මට්ටමේ පවතින බවත් බෙලරුසියානු ජනාධිපතිවරයා ප්‍රකාශකර තිබේ. එම මිසයිල පද්ධති ස්ථානගත කිරීම සම්බන්ධයෙන් වීඩියෝපටයක් ද රුසියාව විසින් නිකුත්කර තිබිණි.

කිලෝ මීටර් 5000-5500ක පමණ දුරක් ගමන්කල හැකි ඔරිෂ්නික් මිසයිල අධික වේගයකින් ගමන්කල හැකි, එමෙන්ම, න්‍යෂ්ඨික බෝම්බ රැගෙන යා හැකි මිසයිල විශේෂයක් වේ. මේ වන විට ඔරිෂ්නික් මිසයිල පද්ධති 10ක් පමණ බෙලරුසියාවේ ස්ථානගත කර ඇති බවට ප්‍රකාශ පලවී ඇත. එක් පසෙකින් මෙය යුක්‍රේන යුද්ධය සම්බන්ධයෙන් වැදගත් වන අතර අනෙක් පසින් මෙම ස්ථානගත කිරීම හරහා නේටෝ සංවිධානයට අයත් රටවල් ආසන්නයට රුසියානු මිලිටරි බලය ව්‍යාප්ත කිරීමක් ලෙසද සැලකිය හැකිය.

## ග්‍රීසිය : දැවැන්ත ගොවි විරෝධතා



කෘෂි සහ පශු නිෂ්පාදන මිල පහල යාම, ගෙවීම් ප්‍රමාද වීම, නිෂ්පාදන පිරිවැය ඉහල යෑම යන කරුනු මුල්කරගනිමින් සමස්ත ග්‍රීසිය පුරා විසිර සිටින ගොවීන් පසුගියදා දැවැන්ත විරෝධතා ක්‍රියාමාර්ගවල නිරත විය. ට්‍රැක්ටර් ඇතුලු කෘෂි ක්ෂේත්‍රයේ යන්ත්‍රෝපකරණ මගින් මහාමාර්ග අවහිර කරමින්, අධිවේගී මාර්ග සහ ගුවන්තොටුපල ප්‍රවේශ අවහිර කරමින්, දේශ සීමා පිවිසුම් සඳහා බාධා කරමින් පැවති මෙම විරෝධතාවල බලපෑම යුරෝපා රටවල් ගණනාවකට දැනී තිබේ.

සමහර විරෝධතා විසුරුවාහැරීමට පොලීසිය කඳුලුගෑස් පවා භාවිතා කර ඇති අතර ගොවීන්ට එරෙහි නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් ද ඇත. කෙසේ නමුත් නොවැම්බර් මස අවසානයේ සුලු පරිමාණයෙන් ආරම්භ වූ මෙම විරෝධතා තවදුරටත් වර්ධනය වෙමින් පවතී.

## චිලිය : අන්ත දක්ෂිණාංශික ජනාධිපතිවරයෙක් පත් වී



චිලියේ පැවති ජනාධිපතිවරණයෙන් පසුගිය දෙසැම්බර් 14 දින ජයග්‍රහණය කිරීමට අන්ත දක්ෂිණාංශික අපේක්ෂක හොසේ අන්තෝනියෝ කාස්ට් සමත්විය. ඒ ජනාධිපතිවරණයේ දෙවන වටයේදී සමස්ත වලංගු ඡන්දවලින් 58%ක ප්‍රතිශතයක් ලබාගනිමිනි.

ජනාධිපතිවරණයේ ප්‍රථමවටයේදී 27%ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගනිමින් කොමියුනිස්ට් පක්ෂ අපේක්ෂිකා ජැනට් හාරා ඉදිරියෙන් සිටි අතර අන්තෝනියෝ කාස්ට් 24%ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගනිමින් දෙවන ස්ථානයේ පසුවිය. කෙසේ නමුත් කිසිවෙකුට 50%ක ඡන්ද ප්‍රතිශතය ලබාගැනීමට නොහැකි වීම නිසා ඔවුන් දෙදෙනා අතර පැවැත්වූ දෙවන වටයෙන් ජයග්‍රහනය කිරීමට අන්තෝනියෝ කාස්ට් සමත්විය. ලබන වසරේ මාර්තු මාසයේ සිට ඔහු ජනාධිපතිධුරයේ වැඩකටයුතු ආරම්භ කිරීමට නියමිතව ඇත.

# ආපදාවෙන් පසු නැඟීසිටින රටක්



දිට්වා සුළි කුණාටුව ලංකාවට සමාජ, ආර්ථික සහ දේශපාලනික යන අංශ තුනටම එක ලෙස විශාල ලෙස බලපෑ අතරම එය විශාල සමාජ ගැටලු ගණනාවට මෙන්ම ජාතික ආර්ථිකයටද විශාල බලපෑමක් ඇති කළේය. එලෙසම පොදු විපක්ෂය ඇතුළු සියලු හතුරු බලවේගවලටද තමන් බලාපොරොත්තු වූ ආකාරයේ විනාශයක් නොවීම නිසා සහ සමාජ ගැටලු ගණනාවක් නිර්මාණය වීමට තිබූ ඉඩකඩ ඇහිරී යාම විසින් ආපදාවෙන් ලබාගැනීමට බලාපොරොත්තු වූ දේශපාලන වාසියද ලබා ගැනීමට නොහැකි විය. මේ සියලු කාරණා සියුම්ව හැදෑරීමෙන් මෙම ආපදාවෙන් සිදුවූ අවාසිදායක තත්වයන් මෙන්ම රටක් ලෙස නිර්මාණය වූ අවස්ථා ගැනද අදහසක් ලබාගැනීම ඉතා වැදගත්ය.

පසුගිය වසර විසිපහ තුළ ශ්‍රී ලංකාව මුහුණ දුන් මෙවැනි ඛේදවාචක අතර 2004 වසරේ සිදුවූ සුනාමි ව්‍යසනයත් ඉන්පසුව 2020 සිදුවූ කොරෝනා වසංගතයත් අප රටට අවාසි සහගත ලෙස බලපෑ අතර ඉන්පසු සිදුවූ විශාලම ආපදාව ලෙස දිට්වා සුළි කුණාටුව හැඳින්විය හැකිය. සුනාමි උවදුර නිසා සිදුවූ ජීවිත හානි ප්‍රමාණය විශාල වුවත් (35,000 ක් පමණ මිය ගිය බව වාර්තා විය) එයින් ආර්ථිකයට සිදුවූ බලපෑම දිට්වා සුළි කුණාටුවට වඩා අඩු තත්වයකි. එයට හේතුව සුනාමි තත්වය දිස්ත්‍රික්ක කිහිපයකට පමණක් වූ අතර එහිද බලපෑම මුහුදු ආශ්‍රිත නගර කිහිපයකට පමණක් සීමා වීමයි. සුනාමියෙන් සංචාරක ව්‍යාපාරයට කෙටිකාලීනව යම්කිසි බලපෑමක් සිදුවුවත් අනෙකුත් කර්මාන්තවලට එතරම් හානියක් සිදුවුයේ නැත. විශේෂයෙන්ම නිෂ්පාදන ආර්ථිකයට එයින් සිදුවූ බලපෑම එතරම් විශාල නැත.

එලෙසම කොරෝනා වසංගත තත්වය වුවද ආර්ථිකය කෙටි කාලයකට අඩපණ කිරීමට සමත් වුවද විශාල භෞතික සම්පත් ප්‍රමාණයකට හානි සිදුවුයේ නැත. භෞතික සම්පත් විනාශවීම යන කාරණය සැලකිල්ලට ගත්කල මෙම ව්‍යසනයන් දෙකටම වඩා දිට්වා සුළි කුණාටුවේ සිදුවූ හානිය විශාලය. විශේෂයෙන්ම දිට්වා සුළි කුණාටුව නිසා මහාමාර්ග, පාලම්, දුම්රිය මාර්ග, නිවාස, ව්‍යාපාරික ස්ථාන, ජල සහ විදුලිය සැපයුම් මාර්ගවලට සිදුවූ හානිය මගින් ආර්ථිකයට විශාල බලපෑමක් සිදුකර තිබේ. මේවා යථා තත්වයට පත්කර ගැනීම සඳහා රජයට කළ යුතු ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය ඉතා ඉහළය. අනෙක් අතට බංකොලොත් වී තිබුණු ආර්ථිකයක් යන්තම් හිස ඔසවන විටම මෙවැනි ව්‍යසනයක් සිදුවීම විශාල ගැටලුවකි. එක් අතකින් ණය බරින් මිරිකී සිටීමත්, නිෂ්පාදනය අඩු මට්ටමක පැවතීමත් යන ප්‍රධාන ආර්ථික ගැටලු දෙක විසඳා ගැනීමට පෙර මෙම ව්‍යසනයට මුහුණ දීමට සිදුවීම බරපතළ තත්වයකි.

එහෙත් ලෝකයේ මෙවැනි ව්‍යසනයන් හමුවේ රටවල් නැගී සිටි ආකාරයන් ගැන අපට ඕනෑතරම් උදාහරණ ඇත. ඒවා ස්වභාවික විපත්, යුද්ධ, සාගත, වසංගත, මිනිසුන් විසින් නිර්මාණය කරගත් තාක්ෂණික විපත් ලෙස විවිධ රටවලට විවිධ කාලයන්හි පැමිණි අතර නිසි කළමනාකරණයකින් පසුව දිගුකාලීන වාසි සමගින් ඒවා සමනය කරගෙන ඇත. 1995 දී ජපානයේ සිදුවූ කොබේ භූමිකම්පවත්, 2011දී ටොහොකුවල සිදුවූ භූමිකම්පාව සහ සුනාමියත් ජපානය සාර්ථකව කළමනාකරණය කරගත් අතර 2010 චිලියේ සිදු වූ භූමිකම්පාවත්, 1953දී නෙදර්ලන්තයේ උතුරු මුහුද ගොඩගැලීම නිසා සිදුවූ ස්වභාවික විපතත් ඔවුන් විසින් මනාව කළමනාකරණය කරගත් බවට සාක්ෂි ඇත. මෙයට හොඳම උදාහරණය සපයන්නේ 1945දී ජපානයේ හිරෝෂිමා නාගසාකි නගරවලට සිදු වූ විනාශයයි. එහෙත් එම රටවල් ඒ ව්‍යසනයන් හේතුවෙන් සිදුවූ බලපෑම සමනය කරගැනීමට සමත් වූ අතර එසේ කරගැනීමට නොහැකි වූ අවස්ථාද ඇත. ශ්‍රී ලංකාවේදී එලෙස යහපත් ආකාරයට කළමනාකරණය කරගැනීමට තිබූ අවස්ථාවන් දෙකක් මගහැරී ගිය අතර සුනාමිය සහ උතුරේ යුද්ධය අවසන් වීම අප එලෙස මගහැරගත් අවස්ථාවන්ය.

ඕනෑම ආපදා තත්වයක් කළමනාකරණය කරගැනීමත්, එයින් උගතහැකි දේ මගින් පැවති තත්වයට වඩා දියුණු තැනකට යාමත් නැවත එවැන්නක් සිදුවුවහොත් එයින් සිදුවන හානිය අවම කරගැනීමත් රජයක ඇති වගකීමය. ඒ අනුව මෙම දිට්වා සුළි කුණාටු අවස්ථාවේ රජයක් ලෙස අප ගත් ක්‍රියාමාර්ග සලකා බැලීමද ඉතා වැදගත්ය. මෙවැනි කෙටිකාලීන කාලගුණ තත්වයන් හේතුවෙන් සිදුවන ආපදා කල්තියා පුරෝකතනය කිරීම ඉතාම අසීරු කටයුත්තක් වන අතර එය එසේ කළ හැකිනම් ලෝකයේ ඉහළම තාක්ෂණය සහිත දියුණු ධනේශ්වර රටවලට ස්වභාවික විපත්වලින් ගැටලු ඇතිවිය නොහැක. එහෙත් සැබෑ තත්වය එසේ නොවන බව මෑත කාලයේ එලෙස වාර්තා වූ ස්වභාවික විපත්වලින් සිදුවූ හානි ගැන හැදෑරීමෙන් අවබෝධ කරගත හැකිය. මෙවැනි අවස්ථාවකදී රජයකට ගතහැකි ක්‍රියාමාර්ග කොටස් කිහිපයකට වර්ග කළ හැකි අතර ඒ මොහොතේ ඇතිවන තත්වයට මුහුණ දීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග, කෙටි කාලයේදී ජන ජීවිතය යථා තත්වයට පත් කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග සහ දීර්ගකාලීන විසඳුම් ඒවා අතර වේ. පැවති තත්වය සමනය කිරීම සඳහා ජනාධිපතිවරයා ඇතුළු සියලුම දෙනා සෘජුවම මැදිහත් වූ අතර අනතුරට පත් වූ පුද්ගලයන් බේරාගැනීමත්, ඒ සඳහා ක්ෂණික තීරණ ගැනීමත් ඉතා සාර්ථක මට්ටමක පැවතුණි. එනිසාම සිදුවීමට තිබූ ජීවිත හානිය බොහෝ දුරට අවම විය. කලාඔය ප්‍රදේශයේ අනතුරට පත් බස් රථයේ ගමන්ගත් මගීන්ගේ ජීවිත බේරාගැනීම මේ සඳහා හොඳම උදාහරණයයි.

ලෝකයේ බොහෝ රටවල් මෙවැනි ආපදා තත්වයන් කළමනාකරණය කරගනු ලැබුවේ පහත සඳහන් මූලික ක්‍රමවේදයන් මගිනි.

### රජයේ සම්බන්ධීකරණය

මෙවැනි අවස්ථාවකදී රජයේ සම්බන්ධීකරණය අතිශය වැදගත් අතර හමුදාව, පොලීසිය සහ රාජ්‍ය පරිපාලන යාන්ත්‍රණය එකට එක්ව වැඩ කිරීම සහ එයට අවස්ථාව සැලසීම ආණ්ඩුවේ වගකීමකි. පැය විසිහතර පුරාම ක්‍රියාත්මකවූ මැති ඇමතිවරුන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් සහ සේවක කණ්ඩායමුත්, ආණ්ඩුව සකස් කළ යාන්ත්‍රණයන් සහ සියලුම ආපදා කළමනාකරණ කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සම්බන්ධීකරණය කිරීමත් පැවති තත්වය නිවැරදිව කළමනාකරණය කරගැනීමට හේතු විය. අඩුපාඩු සහිතව හෝ එවැනි යාන්ත්‍රණයක අත්දැකීම අනාගතයේදී රට ගොඩනැග ීමේදී අතිශය වැදගත් වේ. පෙර පැවති රජයන් මෙවැනි ආපදා තත්වයන්වලදී මගහැර ගොස් සිටි ආකාරය ගැන ඕනෑතරම් උදාහරණ අප සමාජය සතුව ඇත.

### මහජනතාවගේ විනය සහ සහයෝගය

ආපදා අවස්ථාවකදී මහජනතාවගේ සහයෝගය අත්‍යවශ්‍ය කරුණකි. ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ 'කරදරයකදී පිහිටවීම' වැනි මානුෂීය ගුණාංග මෙහිදී අතිශය වැදගත් අතර මෙම අවස්ථාවේදී ජනතාව රජය කෙරෙහි තැබූ විශ්වාසයද අතිශය වැදගත්ය. වෙනදා ආධාර සහ සහන ලබාගැනීම සඳහා ජනතාවට උද්ඝෝෂණ කිරීමට සිදුවුවත් මෙවර ජනතාවට එලෙස නොවන තත්වයට රජය වගබලා ගත්තේය. ජනතාවට තමන්ට සිදුවූ අලාභය ගෙවීමට වඩා, ඔවුන්ට යහපත් ජීවන තත්වයක් අත්පත් කරගැනීම වෙනුවෙන් රජය මැදිහත්වී කටයුතු කිරීම මෙහිදී දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයකි. මෙයට හොඳම උදාහරණය සපයන්නේ නිවසක් සම්පූර්ණයෙන් අලාභ හානි වූ කෙනෙකුට එහි පැවති තත්වය නොසලකා රුපියල් ලක්ෂ 50ක වන්දියක් දීමට රජය තීරණය කිරීමයි. මෙහිදී ජීවත්වීමට නොහැකි තත්වයේ කුඩා නිවසකට හිමිකම් කී අයෙකුට පවා සාමාන්‍ය හොඳ නිවසක් සාදා ගැනීමේ අවස්ථාව හිමි වේ. ඒ අනුව ආපදාවෙන් පසුව ඔවුන්ට තමන් ගතකළ ජීවන තත්වයට වඩා හොඳ ජීවිතයක් ගෙවීමේ අවස්ථාව උදාවේ.

### විනිවිදභාවයෙන් යුත් රාජ්‍ය අරමුදල් ගොඩනැගීම

මෙය බොහෝ දියුණු රටවල අනුගමනය කරන ක්‍රමවේදයක් වන අතර ආපදාවේ මූලික අවදියේදීම රජය රීබිල්ඩිං ශ්‍රී ලංකා අරමුදල නමින් ආපදා අරමුදලක් ප්‍රකාශයට පත් කළ අතර එය නෛතික වශයෙන් අරඹන තෙක් මහ බැංකුවේ පවතින ගිණුම් යොදාගනිමින් අරමුදල් ඒකරාශි කිරීමට අවස්ථාව ලබාදුන්නේය. මේ නිසා දෙස් විදෙස් පරිත්‍යාග ශීලීන්ට විශ්වාසයකින් යුතුව ආධාර කිරීමට හැකිවීම විශේෂ තත්වයකි. මෙම අරමුදලට මුදල් යොමුකිරීම නිසා රජයට සහන කටයුතු ක්‍රමානුකූලව කරගත හැකි වූ අතරම මෙවැනි අවස්ථාවලදී වංචනික ලෙස ආධාර එකතු කිරීමේ වැඩසටහන් මගින් ප්‍රයෝජන ගන්නා අයටද මෙවර එම අවස්ථාව ගිලිහී ගියේය. ද්‍රව්‍ය ආධාර එකතු කිරීමේදී ජාතික තරුණ සේවා මධ්‍යස්ථානයේ භාණ්ඩ එකතු කිරීමේ වැඩසටහනට විශාල ලෙස භාණ්ඩ ලැබුණේද ආණ්ඩුව කෙරෙහි ජනතාව තුළ තිබූ විශ්වාසය තහවුරු කරමිනි.

### ගොඩනැගිලි ඉදිකිරීම් සම්මතයන් සහ නීතීන් හඳුන්වාදීම


මෙම ආපදාවේ ධනාත්මක කරුණක් ලෙස ගොඩනැගිලි ඉදිකිරීමේ අක්‍රමවත් බවෙහි ඇති අවාසිසහගත බව සහ අවදානම ජනතාවට අවබෝධ කරදීමට හැකියාවක් ලැබීමත්, රජයක් ලෙස මේ සඳහා ස්ථිරසාර වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට තීරණය කිරීමත් රටට දිගුකාලීන වාසියක් ලෙස පවතී. අනුමැතියකින් තොරව කරන ඉදිකිරීම් කෙරෙහි අවධානය යොමු කිරීමටත්, අවදානම් කලාපවලින් මිනිසුන් ඉවත්කිරීමට ගත් තීරණත් මේ මොහොතේ අතිශය වැදගත්ය. එලෙසම නිසි ප්‍රමිතියකින් සහ ඉංජිනේරු උපදේශකත්වයක් සහිතව ගොඩනැගිලි ඉදි කළ යුතු බවට වන තහවුරුවත් අනාගතයේ සාර්ථක සහ සම්මත ලෙස ගොඩනැගිලි සහ නිවාස ඉදිකිරීම සඳහා මග පාදා දී ඇත. එලෙසම පරිසරය කෙරෙහි විශේෂ උනන්දුවක් සමාජය වෙතින් නැගී ඒමද මෙහි ඇති සාධනීය තත්වයකි. අලංකාර මෙන්ම ආරක්ෂිත දියුණු නගර නිර්මාණය කිරීමෙහි අවශ්‍යතාවය අවධාරණය කරගැනීමටද මෙම ආපදා තත්වය විසින් අපට බල කර ඇත.

### ආපදාවකට මුහුණ දිය හැකි ආකාරයේ ආර්ථිකයක්

බංකොලොත්ව පැවති ආර්ථිකයක් ඉතා කෙටි කලකදී, මෙවැනි ව්‍යසනයකට පවා මුහුණ දියහැකි මට්ටමට රැගෙනවිත් තිබීම විශේෂ තත්වයකි. ආපදාව වෙනුවෙන් රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් ණය ගැනීමේ සීමාව වැඩිකර ගැනීමකින් තොරව සම්මත කරගැනීමට හැකිවීම විශාල ජයග්‍රහණයකි. එය ආර්ථිකය යථා තත්වයට පත් කිරීම සඳහා අතිශය වැදගත් වේ. දිට්වා සුළි කුණාටුව නිසා බොහෝ වගාවන්ට හානි සිදුවූ අතර සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්ටද හානි සිදුවිය. මේ සියලු දෙනාටම සහන සලසා නැවත තමන්ගේ ආර්ථිකයන් ශක්තිමත් කරගැනීමට හැකි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකිවන්නේ ආණ්ඩුව විසින් කෙටි කාලයේදී ලබාගත් ආර්ථික ජයග්‍රහණ මතය.

මේ සියල්ල සලකා බැලීමේදී අපට ඇති විශ්වාසය වන්නේ මෙම ආපදා තත්වය නිසා ඇති වූ අවාසි සහගත තත්වයන් කෙටි කාලයකින් මගහරවාගෙන නිසැක ලෙසම රට ඉදිරියට ගෙන යාහැකි බවයි. ඒ සඳහා විදෙස් රටවලින් සහ ජාත්‍යන්තර සංවිධානවලින් ලැබෙමින් පවතින ආධාරත්, ඉදිරියේදී ලැබීමට නියමිත ණය ආධාරත් නිසි ආකාරයට කළමනාකරණය කර රට පෙර තිබූ තත්වයටත් වඩා ඉහළට එසවිය හැකි බව ඉතා පැහැදිලිය. මේ සඳහා අවශ්‍ය වන්නේ අරමුණු සහගත මිනිසුන්ගේ ධෛර්ය සම්පන්න මැදිහත්වීමයි.


මෙවැනි අවස්ථාවකදී රජයකට ගතහැකි ක්‍රියාමාර්ග කොටස් කිහිපයකට වර්ග කළ හැකි අතර ඒ මොහොතේ ඇතිවන තත්වයට මුහුණ දීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග, කෙටි කාලයේදී ජන ජීවිතය යථා තත්වයට පත් කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග සහ දීර්ගකාලීන විසඳුම් ඒවා අතර වේ. පැවති තත්වය සමනය කිරීම සඳහා ජනාධිපතිවරයා ඇතුළු සියලුම දෙනා සෘජුවම මැදිහත් වූ අතර අනතුරට පත් වූ පුද්ගලයන් බේරාගැනීමත්, ඒ සඳහා ක්ෂණික තීරණ ගැනීමත් ඉතා සාර්ථක මට්ටමක පැවතුණි. එනිසාම සිදුවීමට තිබූ ජීවිත හානිය බොහෝ දුරට අවම විය.



"මිනිස් ආධ්‍යාත්මයේ ශක්තිය තරම් ඔරොත්තු දීමේ හැකියාවක් ඇති වෙනත් කිසිදු ද්‍රව්‍යයක් මිනිසා විසින් මෙතෙක් නිපදවනු ලැබ නැත."

**බර්නාඩ් විලියම්ස්**
**(1929 - 2003)**

**බ්‍රිතාන්‍ය දාර්ශනිකයෙකි**



# දිට්වා පැරද වූ ගැහැනු!

"දිට්වා" අනපේක්ෂිත මොහොතක රට තුළට පැමිණ සියල්ල උඩු යටිකුරු කර ආපසු ගිය සුළි කුණාටුව රට සංවර්ධනයේ මාවතට ක්‍රමානුකූලව පිවිසෙමින් හිඳි මොහොතක පැමිණි ආපදාව රටම මොහොතකට නිරුත්තර කරන්නට සමත් විය.

දිට්වා සුළි කුණාටුවෙන් රට පුරා සිදුවූ ආපදා තත්වය හේතුවෙන් ජනජීවිතය බිඳ දමා, ආර්ථිකය හා සමාජය දැඩි අභියෝගයකට මුහුණ දුණි. මහා කඳු බිමට සමතලා වීම හා එහි පාමුල ජීවත් වූ මිනිසුන් යළි සොයා ගත නොහැකි අයුරින් මිහිදන් කරමින් ද නිවාස පමණක් නොව නිවාස තිබූ ඉඩකඩම් පවා අතුරුදහන් කරමින් ද කඳුකරයේ පිහිටීම වෙනස් කරමින් රට තුළ ආපදා තත්වයක් නිර්මාණය කළේය. පළමු පැයේ දී තම සමීපතමයන් අහිමි වූ මිනිසුන් ද දෙමාපියන් අහිමි වූ දරුවන්ද ජීවන මාර්ග අහිමි වූ පුරවැසියන්ද යළි ගොඩනැගෙන්නේ කෙසේදැයි කිසිවක් සිතාගත නොහැකි විය. ජලය, ආහාර, විදුලිය, ප්‍රවාහන හා සනීපාරක්ෂක පහසුකම් සෞඛ්‍ය පහසුකම් වැනි මූලික අවශ්‍යතා බිඳ වැටීම වැනි ගැටලුවලට මුහුණ දුන් විශාල පිරිසක් රට තුළ කඩිනමින් උදව් අවශ්‍ය කණ්ඩායමක් බවට පත්විය. ඒ අනුව මේ සියලු දේ යථාවත් කරමින් රට යළි නගා සිටුවීම සඳහා සියලු දෙනාගේ එකමුතු දායකත්වය අත්‍යවශ්‍ය විය.

මෙම අභියෝගාත්මක අවස්ථාවේදී ලාංකීය පුරවැසියාගේ භූමිකාව අතිවිශිෂ්ට විය. ආපදා තත්වය පැන නැගුණු පළමු අවස්ථාවේ සිටම අනෙකාට හැකි අයුරින් උදව් කරමින් මේ තත්වය සාමාන්‍යකරණය කර ගැනීමට අද මේ මොහොත වන තුරුත් තමන්ගේ කාලය ධනය ශ්‍රමය කැප කරන බොහෝ පිරිසක් අප අතර ඇති බව පසක් විය. ඒ අතර කාන්තාවන්ගේ භූමිකාව විශේෂයෙන්ම වැදගත් වූයේය.

ආපදා තත්වය තුළ පවුල් රැකබලා ගැනීම, දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ යුහුසුළුව කටයුතු කිරීමට කාන්තාවන් සුවිශේෂ දායකත්වයක් ලබා දුනි. අවතැන් වූ ජනතාව සුරක්ෂා කඳවුරුවලට රැගෙන යාම ඔවුන්ගේ මූලික අවශ්‍යතා ඉටු කිරීමට දිවා රෑ නොබලා රාජ්‍ය යාන්ත්‍රණය තුළ හිඳින නිලධාරිනියන් පමණක් නොව පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සිට ගමේ කොට්ඨාස සභාවේ සාමාජික සහෝදරිය දක්වා ම කැපවීමෙන් කටයුතු කරනු දැකිය හැකි විය.

එසේම සමාජයේ සෞඛ්‍යය පවත්වා ගැනීම සඳහා කාන්තාවන් ඉදිරියට පැමිණියහ. උදව් කරන්නට කැමති අයගේ උදව් උපකාර ලබා ගනිමින් තාවකාලික නවාතැන් මධ්‍යස්ථානවල ආහාර සකස් කිරීම, රෝගීන් සහ වැඩිහිටියන් කළමනාකරණය කිරීම, ඔවුන්ට අවශ්‍ය ඇඳුම් පැළඳුම් එක්රැස් කරමින් පහසුකම් ලබාදීම ආදිය වෙනුවෙන් කඩිනම් මැදිහත් වීමක් සිදුවිය.

එසේම සුරක්ෂා කඳවුරුවල ජීවත්වන අපේ ම ජනතාවගේ මානසික සෞඛ්‍ය වෙනුවෙන් විවිධ වැඩසටහන් සංවිධානය කිරීමටද කාන්තාවන් දායකත්වය ලබා දුනි. සෞන්දර්යාත්මක හා විනෝදාස්වාදය ගෙනදෙන වැඩසටහන් සංවිධානය කරමින් ද සෞඛ්‍ය වැඩසටහන් හා මනෝසමාජික සහය ලබා දීම වැනි කාර්යයන් ඔවුන්ගේ නායකත්වයෙන් සිදුවිය. එමඟින් විපතට පත්වූ ජනතාවට නව බලාපොරොත්තුවක් ලබාදීමට හැකි විය. ඒ අතරම කුඩා දරුවන් පිළිබඳ විශේෂයෙන් සොයා බලන්නටත් අපේ සහෝදරියන් අමතක කළේ නැත.

ජන ජීවිතය යළි යථා තත්ත්වයට පත් කිරීමේදීද ආර්ථිකය යළි ගොඩනගා ගැනීමේදීද කාන්තාවන්ගේ දායකත්වය අගනාය. ආධාර එකතු කිරීම, ආධාර බෙදාහැරීම, පිරිසිදු කිරීමේ වැඩසටහන්, සහ නැවත ගොඩනැගීම් කටයුතු සාර්ථකව ඉටුකරන්නට පිරිමි හා හරි හරියට කටයුතු කරන්නට කාන්තාවන්ද මැදිහත් විය. ඔවුන්ගේ ඉවසීම, සංවේදනය සහ සංවිධාන කුසලතාවය මෙම කාර්යයන්හි සාර්ථකත්වයට හේතු විය.

එසේම ගංවතුර බැස ගිය පසු පැවති පිරිසිදු කිරීම් වලදී විශාල කාන්තා දායකත්වයක් රට පුරාම දක්නට ලැබුණි.

ගම් මට්ටමෙන් මෙන් ම වෘත්තීය සමිති මට්ටමින් ද ආයතන මට්ටමින් ද මේ දායකත්වය ලබා දෙනු දැකගත හැකි විය. පහත් වූ කඳු තරමට ම ගොඩ ගැසුණු කසළ කඳු අදින්නට ද පස් කඳු ඇද දමා මං මාවත් එළි පෙහෙළි කරන්නටද තට්ටු ගණන් පිරී තිබූ මඩ සෝදා දමන්නට ද ශ්‍රම දායකත්වය පමණක් නොව මූල්‍ය දායකත්වය ලබා දෙන්නට ද කාන්තාවන් පෙරට ආහ.

එසේ ම රජයෙන් ලබා දෙන වන්දි මුදල් හා සහනාධාර කඩිනමින් ලබා දීමටත් ජනතාව නැවත සුරක්ෂිත ස්ථානවල පදිංචි කරන තෙක් තාවකාලික ස්ථානවල පදිංචි කරවීමටත් රජයේ නිලධාරිනියන් දිවා රෑ නොබලා කටයුතු කරමින් හිඳීම පැසසිය යුතුමය. අන් කවරදාටත් වඩා ආණ්ඩුව ආපදා කළමනාකරණයට දැක්වූ ඉහළ හැකියා ව මත විශ්වාසය තබමින් රැකියාවකට එහා ගිය ජාතික කර්තව්‍යයක් සේ සලකා සෑම කෙනෙකු ම කටයුතු කිරීම සුවිශේෂී තත්වයකි.

කුණාටුව ඇති වූ දා පටන් මසක් ඉක්මගිය තැන වුව ද තවමත් ඒ බර බිමින් නොතියා තම දෙවුර මත වගකීමක් සේ පවරා ගත් ලාංකේය කාන්තාව පිළිබඳ අගය ගිනිය නොහැකිය.

ඒ අනුව, දිට්වා සුළි කුණාටුවෙන් සිදු වූ ආපදාවෙන් පසු රට යළි නගා සිටුවීමේ ගමනේ කාන්තාවන් පෙරමුණ ගෙන කටයුතු කළ බව පැහැදිලිය. ඔවුන්ගේ ශක්තිය, කැපවීම සහ නායකත්වය රටේ අනාගතය ගොඩනැගීමට මූලික බලවේගයක් බවට පත්ව ඇත.

රට ව්‍යවසනයකට පත්වූ මොහොතක පුරවැසි කාන්තාවක්, මවක්, සොයුරියක් ලෙසින් රජයට හා ආණ්ඩුවට සහය වෙමින් රට ගොඩනඟන්නට සහයෝගය දක්වන ගැහැනුන් පිරිසක් හිඳීම රටකට භාග්‍යයකි. අනෙකාගේ දුකේ දී කොන්දේසි විරහිත ව පිහිටට ඒමට තරම් සහකම්පනය සහිත මිනිසුන් සෑම ආපදා අවස්ථාවක දී මෙන් ම මෙවර ද අපි දුටුවෙමු. තම පඩි පත පමණක් නොව තම බත් පත ද අනෙකා වෙනුවෙන් පරිත්‍යාග කරන්නට සිත් පහළ වූ ගැහැනුන් අප අතර විරල නොවීය. මළ සිරුරවත් නොදැක මිහිදන් වූ නොහඳුනන මිනිසුන් වෙනුවෙන් තම දෑසින් කඳුළක් ඉනූ සොහොයුරියන් ද දෙමාපියන් අහිමි දරුවන් වෙනුවෙන් මව් සෙනෙහස උතුරා ගැලූ මව්වරුන් ද අකුරු අහිමි දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කැප වූ ගුරු මව්වරුද අප අතර වූහ. සැබවින්ම ඒ ලාංකේය කාන්තාවන්ගේ සන්නාමයයි. එබැවින්, කාන්තාවන්ගේ දායකත්වය තුළින් රට යළි ගොඩනැංවීම සිහිනයක් නොවනු ඇත.

## සොබා දහමට නසන්නට බැරි මිනිස හැඟුමන් පුරා...

අදත් ඊයෙට වඩා වැඩියෙන්
හිතේ සොම්නස වැඩූ
දනන් සිත් තුළ අඳුර පළවා
පහන් හැඟුමන් දෙඩූ
බිඳින්නට බැරි වෙතැයි සැක ඇති
පවුල් පදනම් කැඩූ
වැටත් නියරත් ගොයම සුරකියි
කාට වෙද අවනඩූ

අනුන් වෙනුවෙන් උපන් කඳුලින්
දින ගණන් නිදි වරා
සොබා දහමට නසන්නට බැරි
මිනිස් හැඟුමන් පුරා
දුකට කඳුළට පිහිට වෙන්නට
අරුම සිත් ඇති තුරා
රටක් ලෙස යළි නැගී ඉන්නට
හැකිය දොම්නස් දරා

අලුත් වසරක් ඇවිත් රහසින්
තවත් වසරක් ගෙවා
රැයත් අඳුරත් පහව ඇති බව
කියයි ගහකොළ පවා
යළිත් කුමට ද ?මළ බැඳී ගිය
නපුරු සිතුවිලි දවා
ගයත් තුඩ තුඩ අලුත් ගීයක්
දුරුතු සීතල නිවා...

## ජන මතය!

ජාතික ළමාරක්ෂක අධිකාරිය අධ්‍යාපන අමාත්‍යාංශය හා එක් ව ළමා ආරක්ෂාව පිළිබද ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායකයින් බලගැන්වීමේ ජාතික වැඩසටහනට සමගාමීව කුරුණෑගල දිස්ත්‍රික් ශිෂ්‍ය තානාපතිවරුන් බලගැන්වීම කාන්තා හා ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය නාමල් සුදර්ශනගේ ප්‍රධානත්වයෙන් සිදු විය. ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් පාසල තුළ නිර්මාණය කිරීම සදහා ශිෂ්‍ය නායකයන්ගේ මූලිකත්වයෙන් සිදුකිරීමට නියමිත ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන පිළිබදව ඔවුන් දැනුම්වත් කිරීම මෙහිදී සිදුවිය.

---

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වන ගර්භණී මව්වරුන් වෙනුවෙන් දෙසැම්බර් මස සඳහා විශේෂ පෝෂණ දීමනාව ලබාදීමේ වැඩසටහනේ සමාරම්භක අවස්ථාව වැල්ලවත්ත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ දී පැවැත්විණි.

---

දේශපාලනය තුළ කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම මේ මොහොතේ ගෝලීය අවශ්‍යතාවක්ව පවතී. ප්‍රතිපත්ති සකස් කෙරෙන, තීන්දු ගැනෙන ස්ථානයන් හි කාන්තා නියෝජනය වැඩිකරගැනීමේ අරමුණින් පළාත් මට්ටමින් කාන්තාවන් දේශපාලනය සඳහා සවිබල ගැන්වීමේ නයකත්ව පුහුණු වැඩමුළු මාලාවක් පසුගියදා පැවැත්විණි. කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධිත ජාතික කාන්තා කමිටුව විසින් මෙම වැඩමුළු මාලාව සංවිධාන කෙරෙන අතර ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ වනිතා සංවර්ධන නිලධාරීන් (**WDO**) සහ එහි ක්ෂේත්‍ර යාන්ත්‍රණය වන(**NCW**) කාන්තා කාර්යය සංවිධාන ව්‍යූහය මගින් ක්‍රියාත්මක වේ.





## ජන ජීවිතය යථාවත් කිරීමේදී කාන්තාවන් ඉදිරියෙන් හිටියා!



**අනුෂ්කා තිලකරත්න**
**නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීනී**

මම නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රී වරියක් හැටියට මේ ආපදා තත්වය පිළිබඳව සජීවී අත්දැකීම් මට තියනවා. නුවරඑළිය තමයි වඩාත්ම ආපදාවට ලක් වු දිස්ත්‍රික්කය. එයිනුත් කොත්මලේ තත්වය තමයි ඉතාම බරපතළ වුණේ. හැබැයි දින දහයක් වගේ කෙටි කාලයක් ඇතුළත කොත්මලේ සාමාන්‍ය ජන ජීවිතය සියයට අසූවකින් පමණ යථාවත් කරන්න අපට පුළුවන් වුණා. ඇත්තටම අපිට මේ කාර්යය කරන්න පුළුවන් වුණේ දේශපාලන අධිකාරිය, රාජ්‍ය යාන්ත්‍රණය සහ පොදු ජනතාව එක මිටකට මෙයට දායක වුණ නිසා. මේ සියලු සිදුවීම් ඇතුලෙ මේ ක්‍රියාවලියේ තිබ්බ කාන්තා සහභාගීත්වය මම දැක්කා.

මේ තත්වය ආරංචි වූ සැණින් පිරිමින් සමග කරට කර තමන්ගෙ ගෙදර තියෙන කැත්ත, උදැල්ල අරගෙන ගැහැනු පාරට බැස්සා. විපතට පත්වූවන්ට උදව් කරන්න. ඒ වගේම තම නිවසේ කන්න අඳින්න තිබූ දේ මිනිස්සුන්ට බෙදා දුන්නෙ කිසිදු පැකිලීමකින් තොරව. කාන්තා සමිති දින ගණන් කෑම ඉව්වා. ගෑස් සිලින්ඩර් කරේ තියන් යන ගැහැනු මම දැක්කා. ඒ වගේම රාජ්‍ය යාන්ත්‍රණය තුළ ග්‍රාම සේවා නිලධාරිනියගේ සිට දිසාපතිතුමිය දක්වාත්, පොලිසිය ඇතුළු ත්‍රිවිධ හමුදාවේ නිලධාරිනියන් තුලළත් තිබූ දැඩි කැපවීම අගය කළ යුතුයි. ඇත්තෙන්ම නුවරඑළිය වගේම ආපදාවට පත් වූ අනෙක් ප්‍රදේශත් යළි යථාතත්වයට පත්කර ගැනීමේ ක්‍රියා වලියේදී කාන්තා සහභාගීත්වය ඉදිරියෙන්ම තිබුණ කියන කාරණය මට කියන්න පුළුවන්.

# පශ්චාත් ව්‍යසන සමයේ කලාවේ කාර්යභාරය



"නූගත්කම අකා මකා දැමීමට අපගේ කොමිසම ප්‍රයත්න දරනු ඇත. නමුත් එය ප්‍රමාණවත් නොවේ. අතීතය සමග සසඳන කල එය විශාල වැඩ කොටසක් ඉටු කර තිබෙන නමුත්, කළ යුතුව තිබෙන දේ සමග සසඳන කල ඉටු කර තිබෙන කොටස අල්පය. අකුරු දැනුම පමණක් නොව, සංස්කෘතිමත් බව, ඥානවත් බව හා ශික්ෂිත බවද ලැබූ වැඩකරන ජනයා අපට අවශ්‍යය."

**ලෙනින්**

**තෝරාගත් කෘති, වෙළුම 11, 128 පිටුව**

ලෝකයේ ව්‍යසන, මිනිසා විසින් ඇති කරනු ලබන සහ ස්වභාවික ව්‍යසන ලෙස කොටස් දෙකකට බෙදිය හැකිය. වර්තමානය වන විට ස්වභාවික ව්‍යසන ලෙස අප හඳුනා ගන්නා සංසිද්ධීන්ද යම් ආකාරයකට මිනිසා විසින් නිර්මාණය කරනු ලබන ව්‍යසන ලෙස අර්ථ දැක්විය හැකිය. විශේෂයෙන්ම කාලගුණික විපර්යාසයන් කෙරෙහි මිනිස් ක්‍රියාකාරකම් බලපාන බැවින්, ගෝලීය උණුසුම ඉහළ යාම හේතුවෙන් මෙන්ම ආන්තික කාලගුණික විර්යාසයන් හේතුවෙන් ඇතිවන සියලුම ආපදාවන්ගේ පදනම මිනිස් ක්‍රියාකාරිත්වය ලෙස පෙන්වා දීම නිවැරදිය.

ස්වභාවික හෝ මිනිසා විසින් නිර්මාණය කරන ලද ඕනෑම ආකාරයේ ව්‍යසනයකින් අනතුරුව නැවත නැගී සිටීම මිනිස් ස්වභාවයේම පවතින උන්නතිකාමී ලක්ෂණයකි. එසේ නොවන්නට ලෝකය මුහුණ දුන් භයානක උපද්‍රව හමුවේ මිනිස් පරපුර මේ වන විට ලෝකයෙන් තුරන් වන තත්වයක් නිර්මාණය විය යුතුය. මිනිසාට එසේ කිරීමට අවස්ථාව සැලසෙන්නේ පරිසරය තමන්ගේ ග්‍රහණයට නතු කර ගැනීමත්, පාලනය කිරීමටත්, තමන්ට අවශ්‍ය පරිදි වෙනස් කර ගැනීමටත් ඇති හැකියාව හේතුවෙනි.

ව්‍යසනයකින් අනතුරුව නැවත නැගී සිටීමේ අභියෝගය ජයගැනීමට මිනිසා තුළ උද්වේගය, උනන්දුව, උත්තේජනය, ධෛර්යය, කැපවීම, පෙළඹවීම ඇති කිරීමේ ප්‍රධාන සංස්කෘතික මෙවලමක් ලෙස කලාව පෙන්වා දිය හැකිය. අප මැනිවින් දන්නා පරිදි, කලාව ආමන්ත්‍රණය කරනුයේ මිනිස් සන්තානයේ අතිශය සංවේදී කලාපයකට වන අතර එමගින් වින්දනාත්ම එළඹුමක් ඔස්සේ, නිර්මාණාත්මකව සිතීමටත්, වෙනස් වෙනත් එළඹුම් ඔස්සේ නව ඉසව් කරා ගමන් කිරීමටත්, එමගින් අපේක්ෂිත ජයග්‍රහණ අත්පත් කර ගැනීමටත් හැකියාව ලබා ගනී. කලාව යනු සරලව ප්‍රලෝබන (Motivation) වැඩමුළුවක් නොවේ. එහිදී සිදුවන්නේ චින්තනයේ නව ඉසව් කිතිකැවීමකි. **පශ්චාත් ව්‍යසන යුගයන් යනු සමාජය වඩාත් අශිෂ්ට වීමේ අවදානමක් සහිත යුගයකි. ඊට හේතුව බොහෝ පිරිස්, සිය සාමාන්‍ය ජීවිතය අහිමි කර ගැනීමටක හෝ එම ජීවිතය නැවත ලබා ගැනීම පෙනෙන සීමාවෙන් එපිට පවතින, කිසියම් ආකාරයක අපේක්ෂා භංගත්වයකින් කටයුතු කරන සමයක් වන බැවිනි. එවන් කාලයක මිනිසා තුළ ස්වභාවිකව පවතින ආත්මාර්ථකාමී හැඟීම්, වඩාත් ආක්‍රමණශීලීව පැන නැගීමේ හැකියාව ඉහළ මට්ටමක පවතී. එබැවින්, නව අපේක්ෂා, සාමාන්‍ය මට්ටමකට වඩා ඉහළ අනුපාතයකින් වැඩි වර්ධනය කරන අතරම ඒවා වඩාත් ශිෂ්ට සම්පන්න කිරීමත් අවශ්‍යය.** මේ සඳහා යොදාගත හැකි එක් සාර්ථක, අනගිබවනීය මෙවලමක් වශයෙන් කලාව හා රසවින්දනය පෙන්වා දිය හැකිය.

ලෝකය මුහුණ දුන් අතිශය දරුණු, මානව නිර්මාණ ව්‍යසනයක් වන්නේ යුද්ධයයි. යුද්ධය යනු, අතිශය ශිෂ්ටාචාරවත් යුගයකද මිනිසා විසින් පවත්වාගෙන යන අතිශය ම්ලේච්ඡ, අතිශය අශිෂ්ට සත්ව ක්‍රියාකාරීත්වයකි. වර්තමානයේ පවා පවතින, ජනවර්ගයන් සමූල ඝාතනය ඉලක්ක කරගත් බවට චෝදනා නැගෙන ගාසා තීරයේ යුද්ධය, ලෝකයේ විවිධ ස්ථානවල ක්‍රියාත්මක වන ආගමික අන්තවාදී යුද්ධයන් මීට උදාහරණ වේ. දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව ඇමරිකානු නව ලෝක බලවතා බවට පත්වීමේ දී විශාල මානසික යුද්ධයක් වූයේ ද කලා නිර්මාණයන්ය. පශ්චාත් දෙවන ලෝක යුද්ධ සමයේ නිර්මාණ අතර ජයග්‍රාහී මිත්‍ර පාර්ශයේ කතාවට වඩා වෙනස් කතාන්තරයක් පරාජිත අක්ෂ බලවතුන් සතුවත් තිබෙන්නට ඇති වුවද ඒවා නිර්මාණ ලෙස එළි දැක්වීමේ ප්‍රවණතාව අඩු මට්ටමක පැවැති බව ප්‍රකට කරුණකි. විශේෂයෙන්ම දෙවන ලෝක සංග්‍රාමයෙන් බිමට සමතලා කරන ලද ජර්මනිය යුරෝපයේ විශාලතම හා ලෝකයේ තෙවන ආර්ථිකය බවටත්, ජපානය දිගු කලක් මුළුල්ලේ ලෝකයේ දෙවන විශාලතම ආර්ථිකය (මේ වන විට එය පස්වන ස්ථානය තෙක් පහළ බැස ඇත) බවටත් පත්වීමේ ධෛර්ය සම්පන්න කතාන්තරය නිර්මාණ බවට පත්වූයේ බෙහෙවින් අඩු ප්‍රවණතාවකිනි.

ජපානයේ NHK රූපවාහිනී ආයතනය විසින් නිර්මාණය කරන ලද ඔෂීන් මාලා නාටකය පශ්චාත් දෙවන ලෝක යුද්ධ සමයේ ජපානයේ ධෛර්ය සම්පන්න නැගිටීම පිළිබඳ කතාන්තරය කියාපාන්නකි. එය විනාශකාරී සිදුවීමකින් පසු රටක් යළි ගොඩනැංවීමේ හැකියාව තුළින් මනුෂ්‍යත්වයේ ශක්තිය නිරූපණය කරන කලා නිර්මාණයකි. 1983 වර්ෂයේදී නිෂ්පාදනය කරන ලද එය කථාංග 297කින් යුක්ත වූ අතර දශක ගණනාවක සිද්ධි පසුබිම් කර ගනී. මේජි යුගයේ අවසානයේ (1907 පමණ) සිට 1980 දශකය දක්වා ජපානයේ ඉතිහාසය තුළ පුද්ගලයෙකුගේ ජීවිතය හා දේශයේ පරිණාමය මෙමගින් නිරූපණය කරයි. මෙම යුගය ජපානය ලෝක යුද්ධ දෙකක ප්‍රධාන පාර්ශවකරුවෙක් වූ යුගයක් විය. ළමා කාලයේ අධික දරිද්‍රතාවය, පීඩනය සහ ස්ත්‍රී පුරුෂ භේදය යන කරුණු මැද ජීවත් වූ කාන්තාවක් තම අත්දැකීම් උපයෝගී කරගනිමින් සාර්ථක ව්‍යාපාරික අධ්‍යක්ෂකවරියක් බවට පත්වීමේ කතාවක් ලෙස මෙය ගලා යයි. මෙමගින් දෙවන ලෝක යුද්ධය, යුද්ධයෙන් පසු ජපානයේ සිදු වූ විනාශය සහ රටේ ආර්ථික සමෘද්ධිය වැනි ජපාන ඉතිහාසයේ වැදගත් සිදුවීම් ආවරණය කරයි.

මෙම කතාව ෂිනො (Shino), ඔෂින් (Oshin) හා තනාචි (Tanaka) නම් කාන්තාවගේ ජීවිත කථාව වටා ගෙතී ඇත. දීර්ඝ ටෙලි නාට්‍ය හෙවත් සෝප් ඔපෙරාවල ලක්ෂණ සියල්ල මෙම නිර්මාණයේ අන්තර්ගතය. දුප්පත් පවුලක උපත ලැබූ ඔෂින් සත්වන වියේ පසු වෙද්දී දුප්පත් ගොවිපලක සේවයට යවන ලදී. එහිදී ඇය අඛණ්ඩවම ශාරීරික මෙන්ම මානසික වද හිංසනයන්ට ලක් වූවාය. තරුණ වියට පැමිණීමත් සමඟ ඇය, පවුලේ අවශ්‍යතා සඳහා ටෝකියෝව වෙත රැකියාවක් සඳහා පැමිණි අතර, එහිදී ඇයට සාම්ප්‍රදායික බැඳීම් සහ යුද්ධයේ බලපෑම් නිසා ඇතිවූ අභියෝගවලට මුහුණ දෙන්නට සිදුවිය.

'ඔෂින්' හි යුද්ධයෙන් පසු යළි ගොඩනැංවීමේ කාලය ඇගේ ජීවිතයේද සහ ජපානයේ ඉතිහාසයේදී විශේෂ වැදගත්කමක් උසුලන කොටසකි. එය තුළින් ඔෂින් තම පවුලේ ආර්ථික තත්වය නැවත ගොඩනඟා ගන්නා අතරම, ජපානය 'අලුත් යුගයක්' බවට පත් වෙමින් පැවතීමද එය ජපානයේ සාමාන්‍ය ජනතාවගේ ජීවිත කෙරෙහි වන බලපෑමද මැනවින් නිරූපණය කරයි. යුද්ධය අවසන් වන විට, ඔෂින් සහ ඇයගේ පවුල දැඩි දුෂ්කර තත්වයකට මුහුණ දී සිටියි. ඔවුන්ගේ නිවහන විනාශ වී ඇත. ආහාර සහ අත්‍යවශ්‍ය භාණ්ඩ දුර්ලභ ය. අධික උද්ධමනය හේතුවෙන් මුදල්වල වටිනාකම පහත වැටී ඇත. ඔෂින්ගේ සැමියා, රියුසකු (Ryuzo), යුද්ධයෙන් ආපසු පැමිණ ඇතත්, හමුදාවේ සේවය කිරීම නිසා ඔහුගේ මානසික සහ ශාරීරික සෞඛ්‍යය බරපතළ ලෙස බිඳවැටී ඇත. ඔහු නිතර අසනීප වන අතර ස්ථාවරව වැඩ කිරීමට අපහසු වේ. ඒ අතරම ජපානය දැඩි සමාජයීය වෙනසකට භාජනය වී ඇත. එය ඇමරිකානු අධිපතිවාදී බලය (Allied Occupation) යටතේ පාලනය වේ. නව ව්‍යවස්ථාවක් හඳුන්වා දෙනු ලැබූ අතර, කාන්තාවන්ට ඡන්දය දීමේ අයිතිය වැනි නව අයිතිවාසිකම් එමගින් ලැබේ. මේ සමාජ අවකාශය තුළ ඔෂින්, තමා හමුවට පැමිණෙන අභියෝග ජයගන්නා ආකාරය නාට්‍යකරු මැනවින් නිරූපණය කරයි.

පවතින තත්වයේ බලපෑම මතම ඔෂින් නිතැතින්ම පවුලේ ප්‍රධානියා බවට පත්වේ. මෙම අභියෝගවලට මුහුණ දෙමින්, පවුලේ ප්‍රධාන ආදායම් උපායමාර්ගය ලෙස ඔෂින් කුඩා කඩකින් ආරම්භ කරයි. අනතුරුව ඇය තමන්ගේම සුළු පරිමාණ කඩය ('ෂිරෝයිමා'/Shiroyama) මුලදී අසල්වැසියන්ට අවශ්‍ය මූලික භාණ්ඩ (සබන්, තෙල්, ආහාර ද්‍රව්‍ය) අලෙවි කරන අතර, එහිදීද පශ්චාත් යුද්ධ සමයේ ජපාන සංවර්ධන පිම්මේ දැවැන්ත පදනම වූ "ප්‍රමිතියෙන් ඉහළ භාණ්ඩ අලෙවි කිරීම" යන සංකල්පය තුළ අය තදින් කටයුතු කරයි. ඇගේ සමස්ත ව්‍යාපාරයම ගුණාත්මකභාවය සහ විශ්වාසනීයභාවය මත කේන්ද්‍රගත වේ. යුද්ධයෙන් පසු භාණ්ඩ හිඟයකට මුහුණ දුන්නද, ඔෂින් කිසි විටක මිල ඉක්මවා හෝ ගුණාත්මකභාවයෙන් අඩු භාණ්ඩ අලෙවි නොකරයි. එමගින් ඇය වෙළඳාමේ දීර්ඝකාලීන පදනම වන සාධාරණත්වය මඟින් පාරිභෝගික විශ්වාසය දිනා ගැනීම සිය ව්‍යාපාරයේ පදනම බවට පත්කර ගනී. කවර හෝ වේවා පශ්චාත් ව්‍යසන සමයක වැදගත්ම සාධකයක් වන්නේ මෙවැනි පාවා නොදෙන උසස් මානව ගුණාංග යන්ගෙන් සමන්විත බවට සෙසු පිරිසගේ විශ්වාසය දිනා ගැනීමයි. ඇයට රටේ පැවැති තත්වය හේතුවෙන් පැන නගින බාධකවලට අමතරව කාන්තාවන් වීම හේතුවෙන්ම මුහුණ දීමට බල කෙරී ඇති දුෂ්කරතා රාශියකටද මුහුණ දෙයි. ඒ සියල්ල ජයගනිමින් ඇය 'ෂිරෝයිමා' විශාල සුපිරි වෙළඳසැලක් බවට පත්කරයි. කලක් ගතවන විට, ඔෂින්ගේ කුඩා වෙළඳසැල ජපානයේ ආර්ථිකය Economic Miracle ලෙස හඳුන්වන වේගවත් වර්ධනය කාලය සමඟ එක්ව වර්ධනය වේ. එය ක්‍රමයෙන් විශාල වෙළඳසැලක් බවට පත් වන අතර, පසුව විශාල සුපිරි වෙළඳසැල් දාමයක් බවට පරිණාමය වේ. මෙය ජපානයේ යුද්ධයෙන් පසු යළි ගොඩනංවන ලද නගරවල පවුල්වලට නවීන භාණ්ඩ සැපයීමට මෙම වෙළඳ ජාලය උපකාරී වේ. ජපානයේ මීළඟ පරපුර නියෝජනය කරන ඇයගේ පුතා, තාරෝ (Taro), ව්‍යාපාරයේ වැදගත් කොටස්කරුවෙකු බවට පත් වන අතර, නවීන කළමනාකරණ ක්‍රමවේද ව්‍යාපාරයට හඳුන්වා දෙයි. මෙය පරම්පරාගත අගයන් සහ නවීන ව්‍යාපාර ක්‍රම අතර සම්බන්ධයක් නිරූපණය කරයි.

ඔෂින්ගේ සාර්ථකත්වය යුද්ධයෙන් විනාශ වූ ජපානය නැවත ගොඩනැංවීමේ කථාව හා සමාන්තරව පවතී. ඇයගේ කථාව කර්මාන්තකරණය, නාගරීකරණය සහ පාරිභෝගික සංස්කෘතිය වැනි සමාජයීය වෙනස්කම් මැද පවුල් ඒකකයක් කෙසේ ජීවත් විය හැකිද යන්න පෙන්වයි. මෙම කාලය තුළ සාම්ප්‍රදායික ජපන් සමාජයේ, බොහෝ විට පුරුෂාධිපත්‍යය යටතේ සිටි කාන්තාවන්ගේ තත්වයට විරුද්ධව ක්‍රියා කරයි. ඇය තම පවුලේ අභිමතය හා ආර්ථික ආරක්ෂාව සඳහා සක්‍රියව සටන් කරන කාන්තාවක් ලෙස නිරූපණය වේ. විශේෂත්වය වන්නේ බොහෝ සටන්කාමී කාන්තාවන්ට වඩා වෙනස් තලයක, වඩාත් ශක්තිමත්ව ඇය සටන් කිරීමයි. කවර තත්වයක් තුළ වුවද ගෘහනියකගෙන් ගිලිහී නොයා යුතු බවට සමාජය විශ්වාස කරන මාතෘත්වයේ මෘදු ගුණයද, කැපවීමද බැහැර නොකරන ඇය එහි සංකේතයක් බවට පත්වේ.

කවර ව්‍යසනයකදී වුවද ඊට එරෙහිව ධෛර්යයෙන් නැගී සිටීමට "පීතෘ භූමිකාවක්" අත්‍යවශ්‍යය. මෙම තේමාව රැගත් The Day After Tomorrow චිත්‍රපටය, ව්‍යසනයක බිහිසුණු ස්වභාවය මධ්‍යයේ, ඊට එරෙහිව ශක්තිමත්ව මුහුණ දීමේ කතාව ප්‍රකාශ කරයි. රෝලන්ඩ් එමරිච් විසින් අධ්‍යක්ෂණය කළ මෙය ගෝලීය උණුසුම ඉහළ යාම හේතුවෙන් යළි බිහිවන අයිස් යුගයක අත්දැකීමක් කියාපායි. යෝක්ලයිමැටොලොජිස්ට් (පුරාතන කාලගුණ විද්‍යාඥ) වන ජැක් හෝල් විසින් උතුරු අත්ලාන්තික් මුහුදේ ජල ධාරාවක කැළඹීම හේතුවෙන් ගෝලීය උණුසුම්වීම හදිසියේම අතිශයින් දරුණු අයිස් යුගයක් බවට පරිවර්තනය වන බව හඳුනාගනී. ලොව පුරා දැවැන්ත සුනාමි, ටෝනාඩෝ සහ කුණාටු ඇති වන අතර, ජැක්ගේ පුතු සෑම් මෙම ව්‍යසනයට දරුණු ලෙස මුහුණ දෙන නිව්යෝර්ක් නගරයේ සිරගත වේ. ඒ අවස්ථාවේදී ජැක්, එකිනෙකට සමාන, එහෙත් එකිනෙකට වෙනස් භූමිකාවන් තුනක තීරකයා බවට පත්වේ. රටේ සිටින හොඳම කාලගුණ විද්‍යා මහාචාර්යවරයා වශයෙන්, කිසිවක් සරලව වටහා ගැනීමේ ප්‍රායෝගික බුද්ධිය රහිත, උද්දච්ඡ දේශපාලඥයෙකු වන උප ජනාධිපතිවරයාට ව්‍යසනයේ බරපතළකම වටහා දීමේ අභියෝගයට ඔහු මුහුණ දෙයි. විශේෂඥ වෛද්‍යවරියක වන ඔහුගේ බිරිඳට, සිය රෝගීන් තනිකර දමා ආරක්ෂිත ස්ථානයකට යා නොහැකි වන අතර ඇයගේ ආරක්ෂාවට, ඇය අසලින් සිටීමට



11 වැනි පිටුවට

# පොලිටිකල් පංතිය

පොලිටික්ක ටික දවසක් ආවෙ නැති හින්ද ළමයි පීරියඩ් එක ගෙවෙන්න ඩෙස්වලට ඔළු තියාගෙන හිටියෙ. කතා කරන අයටත් කොන්දේසි දාලා තිබුණෙ කාට හරි ඇහැරුණොත් කතා කරපු කෙනාට වගකියන්න වෙනව කියල. මේ අල්ලපනල්ලෙ තමයි මේ මොකවත් දන්නෙ නැති පොලිටික්ක මොකක්දෝ සද්දෙට කියාගෙන පංතියට ආවෙ.

"මොකාද කෑගැහුවෙ... කිවුව නේද කෑගහන්න එපා කියල..." කනිය කිවුව සැර සද්දෙට පොලිටික්කත් ඇත්තටම බය වුණා වගේම පංතියම ඔළු ඉස්සුව.

"ඇයි ඇයි මොකද?... මොකක්ද කේස් එක... කවුද ඇවිල්ල ඉන්නෙ" පොලික්කට පංතිය දිහා බැලුණෙ ප්‍රින්සිපල් නෙමෙයි අධ්‍යාපන අධ්‍යක්ෂවත් පංතියට ඇවිල්ලද හිටියද කියන සැකේට.

"අයියෝ නෑ සර්... ගණන් ගන්න එපා... මේ අපි අපිම තමයි..." කනිය කිවුවෙ පොලිටික්කගේ කටහඬේ බිඳුණුකම දැනුණා වගේ... "අපි කෑගහනවට කොන්දේසි දාලා ඔළුව ගහගෙන හිටියෙ... සර් කියල දන්නෙ නෑනෙ"

"ආ.. ඒක මිසක්... ඔය ළමයි කරන වැඩත් එක්ක මම කියාගෙන ආපු දේත් අමතක උණානෙ" පොලිටික්ක වහලෙ දිහා බලාගෙන මතකය අලුත් කරනව.

"හරි... මතක් වුණා... මාලිමාවෙ මන්ත්‍රී කෙනෙක්ගෙ ගංජා හේනක් අහුවෙලාලු නේද?" 'බොරු' නිවුස් බලන අතරෙ පොලිටික්කගෙ ඔළුවට රිංගල හිරවෙච්ච මතකෙ එළියට පැන්න.

"ආ... ඒ බොරුව ඉවර වුණානෙ" මංජුව ලත් තැනම ලොප් කළා.

"ඒක බොරුද?" පොලිටික්ක ටියුබ් ලයිට් වගේ... "එතකොට අර ඒක අල්ලපු පොලීසියෙ කෙනාට මන්ත්‍රී ගහලත්ලු නේද?"

"ඔක්කොම ගොතපු බොරුනෙ... ගංජා 'හේන' පැල දෙක වුණා. ඉඩම මන්ත්‍රීගෙ ඥාතියෙක්ගෙ ඉඩමට අල්ලපු ඉඩමක් කියල හොයාගත්ත... පෝච්චියක හිටවලා ගෙනත් තියල කියල අහුවුණා. පහර දුන්න කතාව බොරු කියල සීසීටීවීවලින් අහුවුණා. අන්තිමට කතාව ගොතපු පොලිසියෙ කෙනා වැඩ තහනම් වෙලා ගෙදරත් ගිහින් ඉවරයි. දැන් මිනිහට ජීවත් වෙන්න විදිහක් නෑ කියලත් කියනවා... පවු... නාට්‍ය පිටපතට උදව් කරපු සජබෙ මන්ත්‍රීලවත් බලන්නෙ නැද්ද දන්නෙ නෑ..." මංජුව බ්ලාස්ට් කරලම දැම්ම...

"දන්නවද සර්... ඔයා ඔය නිවුස් එක දැක්ක 'බොරු' නාලිකාව ඒඅයිවලින් පොලිසියෙ කෙනාගෙ බයික් එක වටකරල ගහනවා හිටන් හදල පෙන්නල... ප්‍රවෘත්ති වාර්තාකරුවෝ විතරක් නෙමෙයි, ප්‍රවෘත්ති නිර්මාණකරුවෝ... ප්‍රේක්ෂකයින්ට සිද්ධිය මවාගන්න උදව්වක් විදිහට වෙන්න ඇති නේද? බලන අය ගැන හුඟක් හිතනවනෙ..." බස්ස පොලිටික්ක අඳින්න හදපු පින්තූරෙ කුඩු කරල දැම්ම.

"දැන් බලන්න ආණ්ඩුව ආපදාවට මිනිස්සුන්ට සහන දෙනවා කිවුවට තාම දීලා නැහැල්ලුනෙ" පොලිටික්කට වදින්නෙ වෙනම ග්‍රහලෝකෙක නිවුස්. "දේශපාලන බලපෑම් හින්ද රජයේ නිලධාරීන්ට හරියට වැඩකරන්නත් බෑ කියන්නෙ..."

"දැන් ඔය කතාව කියන්නෙ කොට්ඨාස දෙකයි. සුන්බුන් විපක්ෂෙ අයයි එයාලගෙ යාළුවොයි... 'බොරු' නිවුස් කට්ටිය" කනියාගෙ මාධ්‍ය විශ්ලේෂණයට ටක්කෙටම අහුවුණා.

"ඇත්ත කතාව දැන් 25,000 දෙන එක හුඟක් තැන්වල 100%ම දීල. 50,000 දීගෙන යනවා. ගෙවල් නාය ගිය අයට ඉඩම් දෙන්න ඉඩම් අඳුනගෙන යනවා. ඉක්මණටම ගෙවල් හදාගන්න ලක්ෂ 50ක් දෙනවා. පාරවල් හදලා, පාලම් හදලා, කැඩුණු ඇලවේලි හදලා රට ඉක්මණට යථා තත්වෙට පත්වෙනකොට සුන්බුන් කට්ටියට දිරවන්නෙ නෑ. ආපදාවක් වුණාම රටම එකතු වෙලා ඒකට මුහුණ දෙනව වෙනුවට මෙයාලා දේශපාලන පංගුපේරුව. කඳවුරුවලට ගිහින් සල්ලි හම්බ වුණාද අහනවා මිනිස්සුන්ගෙන්, ග්‍රාම නිලධාරියා ඉස්සරහම. කලින් වතු කම්කරුවන්ට රජයෙන් 200ක් දෙන්න එපා කියලා හැපුණා. කම්කරුවො එයාලගෙ පින්තූර පුච්චල වැඩේට එන්ටර් වෙනකොට විරෝධෙ අකුළ ගත්ත. දැන් පුංචි සුන්බුන් කට්ටිය ප්‍රාදේශීය සභා, නගරසභා ඇතුළෙ වතුර බෝතල් සෙල්ලම. කලින් මෙයාලගෙ ලොක්කො පාර්ලිමේන්තුව ඇතුලෙ මේ වගේ පිස්සු නැටුව. ඒවට එයාලට සබ්බුව ලැබුණා. හේදිලාම ගියා. දැන් මේ සුන්බුන්ලගෙ ගෝලයො නගර සභා ඇතුලෙ පිස්සු නටනවා. නිලධාරිනියන්ට වතුර ගහනව. ජරා දේශපාලන සංස්කෘතිය ආයෙත් ගෙන්න හදනවා. එයාලටත් ජනතාව සලකාවි. අනෙක් පැත්තෙන් 'බොරු' නිවුස්ලා ආධාර ගන්න මාලිමාවෙ කම්ටුවලින් අස්සන්ඕනෙ කියල නිවුස් ගහනවා. රජයේ නිලධාරීන්ට දේශපාලන බලපෑම් කරනවා කියනව. ආධාර ලැබුණෙ නෑ කියන්න කියනවා. මොනවද මේ හිඟන නිවුස් ගැහිල්ල...." සමන පොලිටික්ක දිහා බලන් කියාගෙන යනකොට පොලිටික්ක වහලෙ දිහා බලාගෙන පරාලෙ දුවන මීයෙක් පස්සෙ ඇස් දෙකෙන් එලවන්න ගත්ත.

කවුළුව හැර තබමි

# සංවිධානාත්මක පක්ෂයක බල මහිමය...

'දිත්වා' විනාශය හමුවේ ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවේ වේගවත් මැදිහත්වීම අද ලොව පුරා රටවල්වල ඉමහත් ප්‍රශංසාවට ලක්වී තිබේ. විපක්ෂයේ කුහක දේශපාලනය මගින් එය වසා දැමීමට කොතරම් උත්සාහ දැරුවද එය මේ වන විට අතිශය නිෂ්ඵල ප්‍රයත්නයක් බවට පත්ව ඇත.



රට පුරා පැතිරුණු මෙවැනි ව්‍යසනයකදී ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ ආණ්ඩුවට එය සමනය කර ගැනීම සඳහා ක්ෂණික මහැදිහත්වීමක් කිරීමට හැකි වූයේ කිනම් ප්‍රමුඛ සාධකයක් නිසාද?

එය අන් කිසිවක් නිසා නොව ලංකාවේ සංවිධානාත්මකම දේශපාලන ව්‍යාපාරය ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ ජාතික ජන බලවේගය නිසා බව අවිවාදිතය. පහළ සිට ඉහළටත් ඉහළ සිට පහළටත් මනාකොට සැකසූ දේ සංවිධාන යාන්ත්‍රණයකින් සැදුම්ලත් පක්ෂයක් අප සතුවේ නම් කළ නොහැක්කක් නොමැති බව ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ ජාතික ජන බලවේගය යළිත් ඔප්පු කළේය. පක්ෂය නායකත්වය, පංතිය සහ වැඩපිළිවෙළ මනා ලෙස සුසංයෝග වූ පසු ඕනෑම අභියෝගයකට මුහුණ දිය හැකි බව මාක්ස් - ලෙනින්වාදී උගැන්වීමයි. නායකත්වය අවංකවම යම් කාර්යයකට උරදෙන විට පංතියද ස්වේච්ඡාවෙන්ම ඊට අවතීරණ වන බවට නිදසුන් ඕනෑ තරම් අපි මෙම ව්‍යසනයේදී අත්විඳිමින් සිටිමු.

දැන් ආණ්ඩුවට එරෙහි විපක්ෂයේ එකම අවි බවට පත් වී ඇත්තේ බොරුව, මඩ සහ අවලාද පමණි. මේ ආණ්ඩුව තමන්ට එරෙහි වූ සියලු බාධා මකුළුදැල් සේ පිසදමමින් නව ගමන යමින් සිටී. ඉතාලි ජාතික මහාකවි ඩාන්ටේ වරක් පැවසූ පරිදි "ඔබ තෝරා ගත් මගෙහි නොසැලී ගමන් කරන්න. හිස් මිනිසුන් ඕන දෙයක් කියාපු දෙන්" යන භාවිතමය කියමන අද මේ ආණ්ඩුව අනුගමනය කරමින් කටයුතු කිරීම සැබෑ මානුෂීයවාදී දේශපාලනය මේ යැයි යන්නට ඉමහත් ආදර්ශයන් සපයමින් සිටින්නකි.

# ලෝකයේ මස්තබාල්දුම දේශපාලනය...


ලෝකයේ මස්තබාල්දුම දේශපාලනයේ යෙදෙන දේශපාලුවන් සිටින්නේ අපේ රටේ විපක්ෂයේ බව කිවහොත් එය වඩාත්ම නිවැරදිය. පසුගිය 'දිත්වා' සුළිකුණාටු ව්‍යසනයේදී එය යළි යළිත් ඔප්පු විය. එක් අතකින් එය ලාංකේය පොදු ජනතාවගේ භාග්‍යයකි. මන්ද නැවත කිසි දිනෙක බලයට නොඑනසේ ලාංකේය දේශපාලන භූමියෙන් මේ ජනතා ද්‍රෝහී කුහක විපක්ෂයේ භූමිකාව අතුගා දැමීමට දැන් කදිම අවස්ථාවක් උදාවී තිබෙන නිසාය.

ඉන්දුනීසියාවට සුළිකුණාටුව ගෙනා විනාශයේදී ඉන්දුනීසියානු විපක්ෂය කළේ ඉන්දුනීසියානු රජය මෙන්ම වගකීම් ගනිමින් ජනතාවට සිදුවූ විනාශයට පිළියම් යෙදීමට වහ වහා මැදිහත් වීමය. මන්ද විනාශය සිදු වූයේ ආණ්ඩුවකට නොව මුළු මහත් ජනතාවට බව ඔවුන් තේරුම්ගත් නිසාය. නමුත් අපේ රටේ විපක්ෂය කළේ මේ සා විශාල විනාශයක් සිදුව තිබියෙදී රටට ජනතාවට එරෙහිව ජනතාව උසි ගන්වමින් ඊට එරෙහිව බොරු, මඩ, අවලාද නගමින් ඊට අනුබල දෙන ජඩ මාධ්‍ය කිහිපයක්ද පාවිච්චි කරමින් ජනතාවට පාන් භාගයකින්වත් ආධාර නොකර, බොර වූ ගංවතුර දියෙහි දේශපාලන මාළු බෑමය. ඉදිරියේදී බලයට ඒම සඳහා පුංචි හෝ සිහිනයක් තිබුණේ නම් ඔවුහු මේ ව්‍යසනයේදී ඒ පුංචි ඉඩකඩද අහුරා ගත්තෝය. දැන් අපේ රටේ විපක්ෂය යනු ජනතාවට තිබෙන විශාලම ශාපය බව ඔප්පු කර හමාරය. ඉතින් අපේ රටේ ජනතාව




දශක ගණනාවක් තළා පෙළා දැමූ මේ දේශපාලන ශාපය මෙරටින් සදාකාලිකව අතුගා දැමීමේ භාග්‍යමත් අවස්ථාව දැන් ජනතාවට උදාවී තිබේ.

# 'ජඩ' මාධ්‍ය කලාව VS ජන මාධ්‍ය කලාව...



ජඩ මාධ්‍ය කලාව හඳුන්වාදීමේ කිරුළ මේ රටේ පෞද්ගලික විද්‍යුත් මාධ්‍ය දෙකකට හා ඔවුන්ගේ මුද්‍රිත මාධ්‍ය කිහිපයකට හිමි විය යුතුමය. තවද ඔවුන් අනුව පියනගන යූ ටියුබ්කරුවන් කිහිපදෙනාටද අඩුම ගණනේ සහතික පත්‍රවත් හිමි විය යුතුය.

වරක් දූෂණයට ලක්වූ ගැහැනු ළමයෙකු එක්තරා මාධ්‍ය 'ලියන්නෙකුට' මෙසේ ලියා යවා තිබුණි. "මොකක්ද, මිනිහෝ උඹ අර පත්තරේට ලියුවේ. මාව එක මිනිහෙක් දූෂණය කළා මදිවට අර කාලකණ්නියා ගැන පත්තරේට ලියලා මිනිසුන්ගේ අනුකම්පාව ලබාගෙන උන්ගේ අතින් මාව සියදහස්වාරයක් දූෂණය කරනවා. තමුසෙලාටද නිදහස් මාධ්‍යවේදියෝ කියන්නේ. පත්තරකාරයෙක් කරන්න ඕන, ඇත්ත ඇති සැටියෙන් ජනතාවට පහදල දෙන එක. නැතිව කෙල්ලන්ගේ ජීවිත විනාශ කරපු එකෙකුට අනුකම්පාව ලබාදීම නොවෙයි. තවත් කෙල්ලෙකුගේ ජීවිතයක් මේ විදිහට විනාශ නොවෙන්න කරපු වැරැද්දේ බරපතළකම ගැන අනිත් අයටත් තේරෙන්න ලියන්නයි උඹලාට කරන්න තිබුණේ."

දැන් මේ මහා ව්‍යසනය මැද්දේත් සමහර 'ජඩ' මාධ්‍ය කිහිපයක හැසිරීම මීටම සමාන නොවේද? සිද්ධීන් දෙකක් වුවද ඇත්තේ එකම භාවිතයකි.

ජනතාවගේ බුද්ධිය අවදි වන යථා ස්වරූපයෙන් කරුණු ගෙන හැර දක්වන මාධ්‍යවේදීන්ගේ මාධ්‍ය භාවිතයක පහස ලැබීමට ලාංකේය ජනයා 2026 වසරේ වාසනාවන්ත වනු ඇතැයි අපි ඉත සිතින්ම ප්‍රාර්ථනය කරමු.

2025 දෙසැම්බර් 19

# තිබුණාටත් වඩා ඉහළ මට්ටමේ ප්‍රමිතියකින් යටිතල පහසුකම් ගොඩනගනවා

අපේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සුළි කුණාටු තත්වය පිළිබඳ අනතුරු ඇඟවූ මොහොතේ සිටම රජයක් ලෙසට ගත යුතු ක්‍රියාමාර්ග සියල්ලක්ම අපි ක්‍රියාවට නඟා තිබෙනවා. උදාහරණයක් හැටියට මම කියන්නම්, මේ ව්‍යසන තත්වය දැන්වූ මොහොතේ, අවස්ථා තුනකදී, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ශබ්ද විකාශන යන්ත්‍ර යොදාගෙන දැදුරු ඔය ආශ්‍රිත ජනතාව ඉවත් කරන්න කටයුතු කර තිබෙනවා. පොලීසිය ක්‍රියාත්මක වූ ආකාරය අපට වාර්තා කොට තිබෙනවා. ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ, වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඒ පිළිබඳව තීන්දු තීරණ අරගෙන තිබෙනවා. වාරිමාර්ග යටතේ තිබෙන සියලුම ජලාශවල ජලය කළමනාකරණය කිරීමට පියවර ගෙන තිබෙනවා. එපමණක් නොවෙයි ත්‍රිවිධ හමුදාව, පොලීසිය පූර්ව ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ජනාධිපතිතුමා 27 වැනි දින පාර්ලිමේන්තුවට ඇවිත් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු රැස්කොට සියලුම අයව දැනුවත් කළා. ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කළා.

ආපදාවක් සිදුවූ පසුව ඒ සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරයක් තිබෙනවා. ඒ සම්බන්ධ විෂයයන් තිබෙනවා. ආපදා කළමනාකරණයක් තිබෙනවා. ආපදා කළමනාකරණයෙදී පළමුවෙන්ම කළ යුත්තේ ඒ පිරිස් රැකබලා ගැනීමයි. සුරක්ෂිත ස්ථානවල ඔවුන් ස්ථානගත කිරීමයි. දෙවනුව ඔවුන්ට පිසූ ආහාර ලබාදීමයි. තුන්වෙනුව වියළි ආහාර සලාක ලබාදීමයි. රජයක් හැටියට අපි ආපදාවෙදී ගත හැකි සියලුම ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. විෂය භාර අමාත්‍යවරයා හැටියට ජනාධිපතිතුමා සෘජුවම ඒ වෙනුවෙන් මැදිහත් වී තිබෙනවා. ගංවතුරෙන් කොටුවී සිටින මිනිසුන් මුදා ගැනීම මූලික අවශ්‍යතාවක්. ඒ සඳහා හෙලිකොප්ටර් යානා යොදවමින් අපි ඒ අයව මුදා ගෙන තිබෙනවා. ඒ වගේම රජයේ බෝට්ටු යොදවා තිබුණා. ඒවා ප්‍රමාණවත් නොවෙන නිසා ධීවර බෝට්ටු, පෞද්ගලික බෝට්ටු පවා යොදවමින් මුදා ගැනීමේ කටයුතු නිරන්තරව සිදුකළා. මහජන නියෝජිතයන්, පොලීසිය, ත්‍රිවිධ හමුදාව, ග්‍රාම නිලධාරීගේ සිට දිස්ත්‍රික් ලේකම්වරයා දක්වා වූ සියලුම නිලධාරීන් කැපවීමෙන් කටයුතු කළා. ඒ සඳහා මැදිහත් වූ සියලුම දෙනාට ස්තුති කරන්නත් මෙය අවස්ථාවක් කර ගන්නවා.



මහජන ආරක්ෂක අමාත්‍ය ආනන්ද විජේපාල සහෝදරයා

මේ ප්‍රශ්න නගන මහත්වරුන්ගේ කාලයේදී, ඒ කියන්නේ අවුරුදු හතක කාලයකදී ව්‍යසන කළමනාකරණ සභාව රැස්කොට තිබුණේ නැහැ. ජනාධිපතිතුමා පසුගිය අගෝස්තු මාසයේදී මේ කළමනාකරණ සභාව රැස්කළා. 2005 අංකඃ 13 ආපදා කළමනාකරණ පනතේ අඩු පාඩු සංශෝධනය කරන්න තීන්දු අරගෙන තිබුණේ. අපදාවක් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග, අවශ්‍ය තීරණ අරගෙන තිබුණා. නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් දී තිබුණා. මේ ව්‍යසනයෙන් පසුවත් පසුගිය 15දා රැස්වුණා. විපක්ෂ නායකතුමත් පැමිණ සිටියා. සියලුම දෙනාගේ සාකච්ඡාවෙන් පසුව අවශ්‍ය තීන්දු තීරණ අරගෙන තිබෙනවා.

දැන් අපට තිබෙන්නේ ව්‍යසනයෙන් හානියට පත් ජනතාවට අවශ්‍ය සහන සැලසීම සහ මේ ව්‍යසනය හේතුවෙන් අහිමි වූ යටිතල පහසුකම් ගොඩනැගීම. ප්‍රධාන කරුණු තුනක් කෙරෙහි රජය අවධානය යොමු කොට තිබෙනවා. එකක් තමයි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. පාලම්, පාරවල්, බෝක්කු, විශාල ලෙස හානියට පත්ව තිබෙන වාරිමාර්ග පද්ධතිය පිළිසකර කිරීම. දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග මේ වන විට ක්‍රියාවට නගමින් තිබෙනවා. රාජ්‍ය ආයතනවල සෘජු මැදිහත් වීමෙන් ඒ සඳහා මුදල් යොදවමින් නැවත සියලුම ඉදිකිරීම් සිදුවෙමින් තිබෙනවා. ලංකාව තුළ පමණක් නොවෙයි ජාත්‍යන්තරයේ පවා පැසසුමට ලක්වෙන ආකාරයෙන් සියලුම යටිතල පහසුකම් ගොඩනග මින් තිබෙනවා. පිවිසුම් මාර්ග කිහිපයක් හැරුණු විට අනෙක් සියල්ලම ගමනාගමන පහසුකම් ඇතිකොට තිබෙනවා.

අනෙක් කරුණ පෞද්ගලික දේපළ සම්බන්ධ කරුණ. නිවාස පිළිසකර කර ගැනීම සඳහා අවශ්‍ය සංඛ්‍යා ලේඛන දත්ත එකතු කොට තිබෙනවා. පුද්ගලයන් ලක්ෂ 22ක් මේ අනතුරට මුහුණ දුන්නා. සුරක්ෂිත මධ්‍යස්ථාන එක්දහස් දෙසිය ගණනකින් අද තිබෙන්නේ 709ක්. පවුල් 25,976ක පුද්ගලයන් 80,678ක් ඉන්නවා. විශාල ප්‍රමාණයක් ආපසු නිවෙස් කරා ගොස් තිබෙනවා. ඔවුන්ගේ නිවෙස් පිරිසිදු කර ගැනීමට, මුළුතැන්ගෙයි උපකරණ ලබාගැනීමට මුදල් ලබා දෙන්න බිලියන 17.6ක් මුදල් වෙන්කොට තිබෙනවා. මේ වෙන විට ඒ මුදලින් බිලියන 6.4ක් පවුල් දෙලක්ෂ පනස්හත්දහසකට ගෙවා තිබෙනවා. ඉදිරි සති දෙක තුළදී පීඩාවට ලක්වුණු පවුල් සියල්ලටම, හඳුනාගෙන තිබෙන හයලක්ෂ දහදාහටම ගෙවනවා. හාරලක්ෂ අනූතුන්දහසකට මේ මුදල් ගෙවීම කඩිනමින් ගෙවා අවසන් කරනවා.

ගොවිජන සේවා දෙපාර්තමේනතුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හානි වූ කෙසෙල් වගාව, එළවළු වගාව වෙනුවෙන්ද, අපනයන කෘෂි බෝග සඳහාද වන්දි ගෙවීමේ ක්‍රමයක් ස්ථාපිත කර තිබෙනවා. ධීවර කර්මාන්තයට සිදුවූ හානි ප්‍රතිපූරණය කරන්නේ කෙසේද යන්න අපි සාකච්ඡා කොට තීන්දු තීරණ අරගෙන තිබෙනවා. පශු සම්පත් ක්ෂේත්‍රයේ සිදුවූ හානි සම්බන්ධයෙන් ද වන්දි ක්‍රමයක්ද ක්‍රියාත්මක කොට තිබෙනවා. ව්‍යාපාර සහ කර්මාන්ත හානි සම්බන්ධයෙන්ද සහනදායී පොලියක් හා සහනදායී කාලයක් සහිතව ණය මුදලක් ලබා දීමට පියවර අරගනිමින් ඉන්නවා. පසුගිය යුද සමයේ උතුරු නැගෙනහිර ජනතාව මිලියන ගණනින් දශක ගණනක් සුබසාධක මධ්‍යස්ථානවල සිටියා. නිවාස ආධාර හැටියට දුන්නේ රුපියල් එක්ලක්ෂ පනස් දහසක් පමණයි. වන්දි හැටියට රුපියල් ලක්ෂ දෙකක් තමයි දී තිබුණේ. එම වන්දි මුදල් දශක ගණන් දෙන්න බැරිවී තිබුණා. දශක ගණන් අවතැන් කඳවුරුවල හිටියා.

අපි පරිපූරක ඇස්තමේන්තුවෙන් රුපියල් බිලියන 500ක් වෙන්කර ගත්තා. ඒ සියලුම මුදල් මේ රටේ ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙනුත් අවශ්‍ය යටිතල පහසුකම් තිබුණු තත්වයට වඩා ඉහළ මට්ටමින් ප්‍රමිතිගත කරමින් සකස් කරනවා. ඒ සියලු පියවරයන් මේ වන විටත් අපි ක්‍රියාවට නගමින් තිබෙනවා. මේ සඳහා ග්‍රාම නිලධාරී මහතාගේ සිට අමාත්‍ය ලේකම්වරයා දක්වා සියලුම රාජ්‍ය සේවකයන් සක්‍රීයව දායක වෙනවා. මේ ව්‍යසනයේදී අපේ නාවුද හමුදාවේ පස්දෙනෙක්, පොලිස් නිලධාරීන්, ගුවන් හමුදාවේ නිලධාරියෙක්, විදුලි බල මණ්ඩලයේ නිලධාරියෙක්, ජීවිත පරිත්‍යාග කළා. අපි ඒ නිලධාරීන්ට ප්‍රණාමය පුදකරනවා. ඒ ඒ පවුල්වලට කනගාටුව ප්‍රකාශ කරනවා. ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරයා, දිස්ත්‍රික් ලේකම්වරයා, ත්‍රිවිධ හමුදාවට, පොලීසියට අපේ ගෞරවය පුද කරනවා. ස්තුතිය පුදනවා. මේ ව්‍යසනයට මුහුණ දුන් සෑම කෙනෙක්ම රැකබලා ගැනීම පමණක් නොවෙයි, ඔවුන්ට අනාගතයේ සුරක්ෂිත ජීවිතයක් අත්පත් කර දෙන්න අවශ්‍ය කටයුතු සලසා දෙනවා.

## රට ගොඩනැගීමේ...

01 පිටුවෙන්

හැබැයි ඉතාමත් කෙටි කාලයක් තුළ අපිට නැවත රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරිමට සිදුව තිබෙනවා.

ඇති වී තිබෙන ආපදා තත්වයෙන් සාමාන්‍ය ජන ජීවිතය යළි සක්‍රීය කිරීමටත්, ඒ වගේම අපේ ආර්ථිකයට යළි පණ පෙවීම සඳහාත් මෙවැනි පරිපූරක ඇස්තමේන්තුවක් අවශ්‍ය බව මේ පාර්ලිමේන්තුවේ සියලුදෙනා පිළිගන්නවා. නමුත් මම දන්නවා පාර්ලිමේන්තුවේ සහ ඉන් පිටතත් මේ පිළිබඳ සංවාදයක් තිබෙනවා. මේ බිලියන 500 හේතුකොට ගෙන අප්‍රේල් වන විට ආර්ථිකය කඩා වැටෙනවා කියලා ඇතැමුන් ප්‍රකාශ කරනවා. මෙවැනි විශාල මුදල් ප්‍රමාණයක් පරිපූරක ඇස්තමේන්තුවක් මගින් ඉදිරිපත් කිරීම තුළින් ආර්ථිකය විශාල තර්ජනයකට මුහුණ දෙන බවට කෙරෙන මෙම ප්‍රකාශ පිළිබඳ යම් පැහැදිලි කිරීමක් කරන්න කැමතියි.

අපි ඉතා හොඳින් මූල්‍ය විනයක් සහ ඉලක්කයක් සහිතව වැඩ කරපු ආණ්ඩුවක්. මේ 2025 වසර ගත්තොත් මේ වසරේ අපි ආර්ථික ක්ෂේත්‍රයේ වැදගත් සාධක ගණනාවකින් ජයග්‍රහණ ලබා තිබෙනවා. ඔබ දන්නවා දීර්ඝ කාලයක් භාණ්ඩාගාර ගිණුම පවත්වාගෙන ගියේ බැංකු අයිරාවකින්. ඇතැම් විට 33%, 36%ක් වැනි පොලියක් මේ බැංකු අයිරා වෙනුවෙන් ගෙව්වා. 2018 බැංකු අයිරාව බිලියන 180යි. 2019 එය බිලියන 274යි. 2020 බිලියන 575ක් සහ 2021 බිලියන 821ක් වෙනවා. ඒ කියන්නේ ආණ්ඩුවේ බැංකු ගිණුම බිලියන 821 අයිරාවක් වී තිබුණා. හැබැයි 2025 නොවැම්බර් වන විට අපේ ආණ්ඩුවේ භාණ්ඩාග ාර ගිණුමේ ධන අගය බිලියන 1202යි. ඒ කියන්නේ 2021ට සාපේක්ෂව ට්‍රිලියන 02ක ඉහළ යාමක්. එය අපේ රටේ ආර්ථිකයේ ඉතා වැදගත් කරුණක්. එවැනි සංචිතයක් නොතිබෙන්න අපිට අද මේ බිලියන 500 වෙන් කිරීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ.

මේ 2026 අයවැය ලේඛනය ඉදිරිපත් කරන විට අපි කිවුවා බිලියන 3800ක ණය සීමාවක් අපි අපේක්ෂා කරනවා කියලා, නමුත් අපි අයවැය යෝජනා හරහා තවත් බිලියන 60ක් අඩු කර බිලියන 3740ක ණය සීමාවක් පවත්වාගෙන යනවා. අපි මේ බිලියන 500ක අතිරේක මුදල් යොදවන්නේ අපේ ණය සීමාව වැඩි කරන්නේ නැතිව. එය ඉතා වැදගත්. ඒ නිසා දීර්ඝ කාලයකට පසු අයවැය ලේඛනයෙන් අපේක්ෂා කරන ණය සීමා තුළ ආරක්ෂා වීම සඳහා අපිට හැකියාව ලැබී තිබෙනවා.

මේ ජනතාවට යළි තමන්ගේ ජීවනෝපායමාර්ග ආරම්භ කරමින් වඩා ස්ථාවර ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය මදිහත් වීම අපි කරන්නේ කොහොමද කියන එකයි අපේ ප්‍රතිපත්තිමය ප්‍රවේශය වන්නේ. ඒ සඳහා තමයි අපි රුපියල් බිලියන 500ක් අපේක්ෂා කරන්නේ. අපි ලබන වසරට මිලියන 1400ක ප්‍රාග්ධන වියදම් වෙන් කර තිබෙනවා. එම ප්‍රාග්ධන වියදම්වලිනුත් මේ ක්ෂේත්‍රයට යොමු කිරීම සඳහා බිලියන 130ක් පමණ හඳුනාගෙන තිබෙනවා. ඒ වගේම බිලියන 72ත් සමග බිලියන 700කට වැඩි මුදලක් අපි මේ වෙනුවෙන් සමස්ත ප්‍රතිපාදන ලෙස වෙන් කර තිබෙනවා.

මේක අපි පියවරෙන් පියවර ආරම්භ කරනවා. පෙර සඳහන් කළ පරිදි නාය යෑමට භාජනය වු කලාපවල පවුල් 17,648කටම මේ රුපියල් ලක්ෂ 50ක දීමනාව අපි ලබා දෙනවා. මේ සියල්ලම අවදානම් කලාපවලින් ඉවතට ගන්නවා. 2027 වන විට අධි අවදානම් කලාපවල කිසිදු පවුලකට ජීවත් වීමට නොහැකි වන පරිදි නීති සම්පාදනය කරනවා.

ඒ වගේම පූර්ණ වශයෙන් හානි වූ නිවාස ගත් විට, කුරුණෑගල වගේ ප්‍රදේශවල පදිංචි වීමට සුදුසු ඉඩම් තිබෙන අයට රුපියල් ලක්ෂ 50 ලබා දෙනවා. නිවාස ඉදි කරදීමට රජයේ ඉඩම් අත්පත් කර ගන්නා ලෙසට අපි දිස්ත්‍රික් ලේකම්වරුන්ට උපදෙස් ලබා දී තිබෙනවා. අපි රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කළේ මේ ජනතාවගේ ජනජීවිතය යළි ගොඩනැගීමටයි. ඉතාමත් සැලසුම් සහගතව මේ රට යළි යථාවත් කිරීමේ වගකීම අපි ඉටු කරමින් සිටිනවා. අපි සියලුදෙනා එකතුවෙලා මේ වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යමු.

## පශ්චාත් ව්‍යසන සමයේ...

09 පිටුවෙන්

ඔහුට බල කෙරී ඇත. ඒ අතර වැදගත්ම කරුණ වන්නේ ව්‍යසනයට තදින්ම මුහුණ දෙන නිව්යෝර්ක් නගරයේ සිරගතව සිටින සිය පුතු අසලට, පියාගේ භූමිකාවේ වගකීම් ඉටු කරමින් ළඟාවීමයි.

අන් සියල්ලටම ආදේශක පැවැතියේ වුවද, පියාගේ භූමිකාවට ආදේශකයක් නැති බව සනාථ කරමින් සිය පුතා වෙත ගමන් කිරීමත්, ඔහුගේ ආදරය හා රැකවරණය නැවත නතුකර ගැනීමත් මෙම නිර්මාණයේ පදනමයි. ලෝකය කවර තත්වයදී වුවද නැවත ගොඩනගන්නේ මිනිසා විසිනි. එබැවින් කවර ව්‍යසනයකදී වුවද නොනසා රැකගත යුතු දේ වන්නේ මානවවාදයයි. ජැක් වඩාත් බර තබන්නේ එකී මානවවාදය වෙතය.

කවර තරමේ දරුණු ව්‍යසනයදී වුවද නායකයාගේ භූමිකාව අතිශය වැදගත්ය. 2016 වර්ෂයේ, ක්ලින්ට් ඊස්ට්වුඩ් විසින් අධ්‍යක්ෂණය කළ Sully එවන නායකයෙකුගේ භූමිකාව පිළිබඳව කියවෙන නිර්මාණයකි.

US Airways Flight 1549 ගුවන් යානය, 2009 ජනවාරි 15 වෙනිදා ඇමරිකාවේ, නිව්යෝර්ක් නගරයේ ලගුවාර්ඩියා (LaGuardia) ගුවන් තොටුපොලේ සිට චාර්ලට් හා සියටල් (Charlotte සහ Seattle) වෙත පියාසරය ආරම්භ කරන ලදී. නිව්යෝර්ක් වෙලාවෙන් සවස 3.26 ට මේ ගුවන් යානය ගුවන් ගතවන අතර අඩි 2,500 ක් වැනි පහළ උත්තාංශයක දී, එනම් භූමියෙන් නික්ම මිනිත්තුවක් වැනි කෙටි කාලයක් තුළ හවස 3.27ට මේ ගුවන් යානය කුරුල්ලන් සමග ගැටීමකට ලක්වේ. එහි ප්‍රතිඵල යක් වශයෙන් යානය සිය එන්ජින් දෙකම අහිමි කර ගනී. එතැන් සිට කෙටි කාලයක් තුළ සිදුවන සංකීර්ණ සිදුවීම් මාලාවකින් අනතුරුව, එනම් කුරුල්ලන් සමග ගැටී තත්පර 208 කට පසුව යානය, ඒ වන විටත් ජලයේ උෂ්ණත්වය අංශය 5ක් වැනි ඉතාමත් පහළ අගයක් ගන්නා හඩ්සන් ගඟ මතට හදිසි ගොඩබෑමක් කරයි.

ඒ අවස්ථාවේ මෙම යානය මෙහෙයවන්නේ නියමුවා වන Chesley 'Sully' Sullenberger හෙවත් කැප්ටන් සුලී සහ පළමු නිලධාරි Jeffrey Skiles කියන දෙදෙනාය. යානය හඩ්සන් ගඟට ගොඩබා, මිනිස්තු 24 ක් ඇතුළත, වෙරළාරක්ෂක යාත්‍රා 06 මඟින් සියලුම මඟීන් හා කාර්යමණ්ඩලයට අයත් මිනිසුන් 155 ක්, සුළු තුවාල සහිතව, සාර්ථකව මුදාගෙන රෝහල් ගත කරයි. මේ සිද්ධිය ඇමරිකාවේ කොතෙක් ජනප්‍රිය වීද කියන්නේ නම් එය 'The Miracle on the Hudson' හෙවත් "හඩ්සන් ගඟේ ආශ්චර්යය" නමින් අතිශය ජනප්‍රිය සිද්ධියක් බවට පත්විය. කැප්ටන් සුලී වීරයෙක් බවට උත්කර්ෂයට නැංවිණ.

ඒ වෙලාවේ නියමුවා හා පළමු නිලධාරියා අතර සිදුවුණු සංවාදයේ ඇත්ත හඬ පටය අන්තර්ජාලය ඔස්සේ ශ්‍රවණය කළ හැකිය. එහිදී වැදගත්ම කරුණක් වන්නේ අනතුර සිදු වූ වහාම කැප්ටන් සූලී විසින් කරන මේ කෙටි දෙබසයි.

"පාලනය මට දෙන්න!"

එහිදී, නියමුවා වඩාත් පළපුරුද්ද සහිත මිනිසා විදිහට පමණක් නොව, ඉන් ඉදිරියට මුහුණ දෙන්නට සිදු වෙන අතිශය අවදානම් සහගත, මරණීය අභ්‍යාසයේ වගකීම නායකයෙක් ලෙස සියතට ගැනීම ව්‍යසනයකදී නායකයාගේ භූමිකාව පිළිබඳව ඓතිහාසික උදාහරණයක බවට පත්විය.
අතිශය තීරණාත්මක අවස්ථාවේ නායකයා සියලුම වගකීම් තමන්ට පවරා ගන්නේ, සැබෑ ව්‍යසන අවස්ථාවක එසේ වගකීම් දැරීමේ හැකියාව ඇත්තේ නායකයාට පමණක් බවට වන සදාතනික සත්‍යය සනාථ කරමිනි. එහිදී, තමන් මෙන්ම තම කණ්ඩායම පිළිබඳව විශාල විශ්වාසයක් නායකයාට අත්‍යවශ්‍යය. සුලී සිනමාපටය සනාථ කරන තවත් එක් වැදගත්ම කරුණක් වන්නේ තීරණ ගැනීම සම්බන්ධයෙන් නවීනතම තාක්ෂණයන් වන Machine Learning හෝ AI වලට කිසිදා ළඟා විය නොහැකි ඉසව්වක් බවයි.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




ඉන්දියානු රජයෙන් අත්‍යවශ්‍ය ඖෂධ වර්ග, වියළි ආහාර ද්‍රව්‍ය ප්‍රදානයක්



චීන මහජන සමූහාණ්ඩුවෙන් විපතට පත් වූවන් සඳහා මූල්‍යමය ආධාර



එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ මානුෂීය ආධාර තොග දිවයිනට




බංග්ලාදේශයෙන් ශ්‍රී ලංකාවට හදිසි ආධාර




හදිසි සහන ද්‍රව්‍ය සහ සෝදිසි හා ගලවා ගැනීමේ කණ්ඩායමක් රැගත් පාකිස්ථාන ගුවන් යානා



ජපාන විශේෂ වෛද්‍ය කණ්ඩායමක් දිවයිනට

# රට නැවත ගොඩනැගීමට ආධාර කරන්නේ අදූෂිත ආණ්ඩුකරණය නිසයි

## අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය සහෝදරිය

ජාත්‍යන්තර ආයතන තමන්ට වත්මන් ආණ්ඩුව පිළිබඳව විශ්වාස බව ප්‍රකාශ කර තිබෙන බව ප්‍රකාශ කළ අග්‍රාමාත්‍ය හරිනි අමරසූරිය සහෝදරිය, රට නැවත ගොඩනැගීම වෙනුවෙන් අරමුදල් ධ ස්කිරීමට මුළු රටත් සමග ජාත්‍යන්තරය පෙළගැසී සිටින්නේ අදූෂිත ආණ්ඩුකරණය නිසා බවත් කියා සිටියාය.

අග්‍රාමාත්‍යවරිය මේ අදහස් පළ කළේ පසුගිය 18වැනි දින පාර්ලිමේන්තුව අමතමිනි.

ද්විත්වා සුළි කුණාටුව අපේ රටට ව්‍යසනයක් ගෙන දී සති තුනකට පමණ පසුව පාර්ලිමේන්තුව නැවත රැස්වී පරිපූරක ඇස්තමේන්තුව නැවත සම්මත කර ගන්න සූදානම් වෙනවා. ගෙවී ගිය සති තුන තුළ රට නැවත යථාතත්වයට පත්කර ගන්න රජයත්, රාජ්‍ය නිලධාරීන්, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, අපේ රටේ ජනතාව සහ ජාත්‍යන්තර ප්‍රජාව සුවිශේෂී දායකත්වයක් ලබා දුන්නා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් පොදුවේ ගත්තාම විශේෂ දායකත්වයක් ලබා දුන්නා. දිනපතාම රැස්වී ජනාධිපතිතුමා ලබාදුන් නායකත්වය නිසාම ජලය, විදුලිය, මහාමාර්ග, සහ සන්නිවේදනයට සිදුවූ අති විශාල බලපෑමෙන් මුදාගෙන සතුටු විය හැකි තත්වයට ගොඩනගා තිබෙනවා. මෙතනදී සිදුවුණේ එක සිදුවීමක් නොවෙයි. සිදුවීම් ජාලයක්. දැන් පවතින්නේ සාමාන්‍ය වර්ෂාපතනයකින් වුණත් මහා ව්‍යසනයක් ඇති වෙන නාය යාමේ තත්වයක කඳුකරය පවතින්නේ. මුල් අවස්ථාවේ ආරක්ෂාකාරීව ජනතාව මුදා ගැනීමට මෙහෙයුම් සිදුකළා වගේ තාවකාලික සහ දීර්ඝකාලීන නැවත ගොඩනැගීම්වලට සැලසුම් සකස් කිරීමට සිදුව තිබෙනවා. අපි මේ රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන්නේ 2026 වර්ෂයට අදාළ වැඩකටයුතු ටික කරගෙන යන්න.



2025 වසර වෙනුවෙන් බිලියන 75ක මුදල් වෙන්කරගෙන 2026 වෙනුවෙන් තවත් බිලිය 500ක් වෙන්කර ගත හැකිවී තිබෙන්නේ අපේ ආර්ථික සැලසුම්වලට හානියක් නොවෙන ආකාරයෙන්. පුළුල් ආර්ථික සැලැස්මක් තුළ ගමන් කරමින් නැවත ණය බරින් මිරිකෙන්නේ නැතිව නිසි ආකාරයෙන් ආර්ථික කළමනාකරණය තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යනවා.

# "නැණ දිරි මෙහෙයුම" කිසිදු දරුවෙක් තනි නොකිරීම වෙනුවෙනුයි

## වැවිලි කර්මාන්ත අමාත්‍ය සමන්ත විද්‍යාරත්න සහෝදරයා

'දිත්වා' සුළි කුණාටුවෙන් පසු පළමු කොටම ජන ජීවිතයේ මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීම වෙනුවෙන් සුවිශේෂී මෙහෙයුම් කිහිපයක් දියත් කරනු ලැබුවා. ඒ අතරින් එක් මෙහෙයුමක් "දිත්වා පරදවමින් පස් කඳු යට අකුරු සොයන නැණ දිවි මෙහෙයුම" ලෙස නම් කළා. දෙසැම්බර් 20වැනිදා සවස් භාගයේ වැලිමඩ පාසල් ක්‍රීඩාංගණයට 5000ක බල ඇණියක් ගෙනැවිත් සතියක් පුරා ශ්‍රම මෙහෙයුමක් දියත් කළා. විනාශ වුණු පාසල් 181ක්, පෙර පාසල් 52ක් ප්‍රතිසංස්කරණ සඳහා එම බලකාය දියත් කළා. ඉංජිනේරු මහත්වරු, ටී.ඕ. මහත්වරු ඇතුළු නිලධාරීන්ගේ අධීක්ෂණයෙන් එම පාසල් ප්‍රතිසංස්කරණය පිළිබඳව ලබාදුන් උපදෙස් අනුව වැඩ සැලසුම් කර ක්‍රියාත්මක කළා. ස්වේච්ඡා සහන සේවා කණ්ඩායම්, නාවික හමුදාවේ 110ක කණ්ඩායමක්, යුද හමුකාවේ සියයකට වැඩි කණ්ඩායමක්ද මෙම මෙහෙයුමට ඍජුවම සම්බන්ධ වුණා. පාසල් දරුවන්ගේ දෙමාපියන්ද සුවිශාල දායකත්වයක් ලබා දුන්නා. 27වැනි දින රාත්‍රිය වන විට එම මෙහෙයුම අවසන් කර, සමාලෝචනයක් සිදු කළා.

මෙහෙයුම දියත් කළ සත්දින පුරාමත් රාත්‍රී කාලයේදී සමාලෝචන සිදුකර ඉදිරි වැඩ සැලසුම් සහගතව දියත් කළා. මෙම මෙහෙයුමට සම්බන්ධ වූ සියලු දෙනාට විශේෂ ස්තුතියක් පිරිනමනවා. එම මෙහෙයුම නිසා 75,000කට වැඩි අපේ දරුවන් පිරිසට පාසල් ආරම්භයේදීම අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව සහ ඔවුන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීමට හැකි වුණා. ඒ වගේම විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්, අපේ රටේ මානවවාදීන් ඇතුළු විවිධ කණ්ඩායම් මෙම මෙහෙයුම් සඳහා ආධාර ලබාදුන් බවත් සඳහන් කරන්න ඕනෑ. ශ්‍රම කණ්ඩායම් විදුලි ආලෝකය මධ්‍යයේ රාත්‍රී කාලයේදී පවා නිදිවරාගෙන කටයුතු කළා. බරපතළ හානි සිදුවූ පාසල් කිහිපයක කටයුතු ඉතිරි වී තිබෙනවා. මිනිස් ශ්‍රමය දින 33891ක් මෙම මෙහෙයුමට ලබා දුන්නා. 5000ක බල ඇණියක් යෙදවීමට සැලසුම් කළත් සමහර දිනවල 8000 ඉක්මවූ පිරිසක් සහභාගී වූ අවස්ථාද තිබුණා. වයෝවෘද්ධ අය වගේම දරුවන්ද කණ්ඩායම් වශයෙන් මෙම මෙහෙයුම සඳහා හැකි ආකාරයෙන් කුමන හෝ දායකත්වයක් ලබා දුන්නා.

ඔවුන්ගේ ශ්‍රමය වගේම රාත්‍රී කාලයේදී වැඩ කළ කාලයත් අත්හැරීමෙන් පසුවයි ශ්‍රම දින 33,891ක ගණනය කර තිබෙන්නේ. සාමාන්‍යයෙන් රුපියල් 2400ක දෛනික වැටුපක් අනුව ගණන් කළොත් රුපියල් ලක්ෂ 814කට වැඩි මූල්‍යමය වටිනාකමක් සහිත මෙහෙයුමක් දියත් කර තිබෙනවා. සමහර පාසල් ස්ථිරව ගොඩනගන තුරු තාවකාලිකව දරුවන්ට අධ්‍යාපනය ලැබීම සඳහා සූදානම්



කළ බවත් කියන්න ඕනෑ. නැණ දිරි මෙහෙයුම මඟින් විශේෂයෙන්ම මේ රටේ කිසිදු දරුවෙක් තනි නොකරනවාය කියන පණිවිඩය ක්‍රියාවෙන්ම ඔප්පු කර තිබෙනවා. ඒ සියලුම දෙනාට අපගේ ගෞරවය පිරිනමනවා.

# ජනතාව නොමග යවන ප්‍රචාර සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුයි

## කෘෂිකර්ම, වාරිමාර්ග හා ඉඩම් අමාත්‍ය කේ.ඩී. ලාල් කාන්ත සහෝදරයා

කොත්මලේ ජලාශය භාර ප්‍රධාන ඉංජිනේරු මහතා ඇතුළු නිලධාරී කණ්ඩායම ජලාශ බැම්ම උඩ පවතින තත්වය පිළිබඳව විශේෂ නිරීක්ෂණයක් කළා. කොත්මලේ වේල්ල සම්බන්ධයෙන් ගෙන යන බොරු ප්‍රචාර නිසා ගම්පොළ නගරයේ ජනතාව ඇතුළු ජනතාව බියකින් සිටීම පදනම් කර ගෙන විශේෂ නිරීක්ෂණ චාරිකාවට අපි සියලු දෙනාම එක් වුණා. කොත්මලේ වේල්ල කඩාගෙන යාමේ අනතුරක් ඇති බවට බොරු ප්‍රචාර ගෙන ගියා. වේල්ලේ පිපිරීමක් ඇති බවත්, එය රහසක් ලෙස සඟවා තබාගෙන ඇති බවත්, ප්‍රචාරය කළා. මේ නිසා කුඩා වැස්සකට වුණත් ජනතාව බියට පත්වෙන තත්වයක් උද්ගතව තිබුණා. ඒ නිසා ජලාශ බැම්ම පිළිබඳව නිවැරදි තත්වය තේරුම් ගන්න අදාළ වගකිව යුතු නිලධාරීන් සමග ජලාශ බැම්ම පිළිබඳව තොරතුරු සොයා බැලුවා. කාර්යභාර ඉංජිනේරු මහතා අවධාරණයෙන් කියා සිටියේ වේලලේ කිසිම පිපිරීමක් නැති බවයි. ජලාශ බැම්ම උඩින් කොන්ක්‍රීට් යෙදූ පාරක් තිබෙනවා. ඒ පාරේ කොන්ක්‍රීට්වල පිපිරීමක් තිබෙනවා. ඒ මිස බැම්මේ කිසිදු ඉරිතැලීමක් නැති බව තහවුරු වෙනවා. සාමාන්‍ය වැසි තත්වය යටතේ මේ ජලාශය සම්බන්ධයෙන් කිසිදු අනතුරක් දැනට නැහැ.



නමුත් යම් දවසක පසුගිය කාලයේ ඇති වුණු සුළි කුණාටුව වැනි බරපතළ තත්වයක් ඇති වුවහොත් මේ බැම්ම සම්බන්ධයෙන් නැවත පරීක්ෂා කළ යුතුව තිබෙනවා. ඒ අතරතුර ජලාශ බැම්ම කෙළවරේ තිබෙන කන්දේ කලින් නොතිබුණු පැලුම් කිහිපයක් ඇතිව තිබෙනවා. ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් ඒ පිළිබඳව සොයා බලා වාර්තාවක් ලබා දීමට නියමිතයි. ඒ පිපිරීම් දැනට විශාල වශයෙන් බලපෑමක් සිදු නොවන බව පැහැදිලියි. නමුත් අවසාන වශයෙන් ඒ පිළිබඳව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් පුළුල් පරීක්ෂණයක් සිදුකර ඉක්මනින්ම වාර්තාවක් ලබා දිය යුතුයි. ඒ නිසා වේල්ල නිසා හෝ ජලාශය නිසා ජනතාවට බිය වීමේ හේතුවක් නැහැ. ජලාශ බැම්මට පහළින් නායයෑම් තත්වයන්හි වර්ධනයක් අලුතින් ඇති වී තිබෙනවා. ඒ වගේම අනතුරුදායක තැන්වලින් ජනතාව ඉවත් කිරීමේ දැඩි තීරණයක් රජය ගෙන තිබෙනවා. ඒ ජනතාව ඉවත් කර, නැවත ඉඩම් ලබාදීමේදී මෙවැනි අවදානම් නැති කලාප හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගන්නවා.

මේ ජලාශයේ තිබෙන්නේ දොරටු තුනයි. නමුත් පසුගිය කාලයේ ජලාශයේ දොරටු පහක් විවෘත කළ බවටත් බොරු ප්‍රචාර ගෙන ගියා. රටක්ම අස්ථාවර කර, ජනතාව නොමග යවන බොරු ප්‍රචාර සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුයි. ජලාශය භාර සියලුම කාර්ය මණ්ඩලය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිවේදන සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කරමින් ඉදිරි ක්‍රියාමාර්ග නිවැරදි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට කැපවී සිටිනවා.


2026 දින දසුන

ආධාරය රු.100/-





බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.